# ‘පට්ඨාන’ විසිපස්වෙනි දේශනාව (විපාක ප්‍රත්‍යය)

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සර්වඥ සම්මාසම්බුදුරජාණන් වහන්සේට දෙසිතක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්නාගත වූ 80 ක් අනුව්‍යංජන ලක්ෂණයන්ගෙන් සමන්නාගත වූ 108 ක් මංගල ධර්මයන්ගෙන් සමන්නාගත වූ ශ්‍රී දේහයක් දරන්නාවූ පුණ්‍ය දේහයක් දරන්නාවූ සමාධි ධර්මයන්ගෙන් උත්තරීතර භාවයට පත්වුනාවූ සීලය උතුම් ලෙස වැඩුවාවූ ප්‍රඥාව සර්වඥතාඥානය දක්වාම වැඩුවාවූ දසබල ඥානයන්ගෙන් සමන්නාගත වූ අනන්ත කරුණාවක් ඇත්තාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ ගුණ සිහිපත් කරලා මේ වෙලාවේදී සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේ විසින් දැන අවබෝධකොට ගත්තාවූ ඉතාමත්ම මදුර මනෝහර සූක්ෂම වූ සත්වයන්ගේ නිවීම දක්වන්නාවූ ඒ උතුම් ශාන්ත වූ ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන්කොට නිවනින් සැනසීම ලබා ගත්තාවූ අෂ්ඨාර්යපුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

අනන්ත අපරිමාණ බුදුගුණ ආනුභාව බලයෙන් දහම්ගුණ ආනුභාව බලයෙන් සංඝගුණ ආනුභාව බලයෙන් තුනුරුවන් කෙරෙහි ප්‍රසාද සිත් පහදවාගෙන ඇතිකරගෙන වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් අසාගෙන සිටින සියලුම දෙනා මුළු ජීවිත කාලය පුරාම මේ මොහොත දක්වාම උපදවා ගත්තාවූ දාන සීල භාවනා ආදී සුපරි සුද්ධ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ අපි මෛත්‍රීයෙන් සිහිපත් කරල දෙන්න බලාපොරොත්තු වෙන ධර්ම කරුණු ටික හොඳින් තේරුම් ගන්ට වටහා ගන්ට සියලු දෙනාටම ශක්තිය ලැබේවා! සිහිය අවදි වේවා! නුවණ අවදි වේවා! නීවරණ ධර්මයන්ගෙන් කිසිදු බාධකයක් පීඩාවක් ඇති නොවේවා! මතුවෙන සියලු කාරණයක් කාරණයක් පාසාම හිත විහිදුවලා නුවණ විහිදුවලා හොඳට ඒ ධර්ම කරුණු තේරුම් අරගෙන මාර්ගයක් හැටියට මෙය වඩාගෙන සැමදෙනාටම සසර දුකින් මිදිලා නිවනින් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස මේ ධර්මය ඇසීමේ පින සහ මේ ධර්මය ඇසීම මාර්ගයක් වේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඉතින් අද මේ පින්වතුන්ට මම ඉදිරිපත් කරන්ට හිතා ගත්තේ සූවිසි පට්ඨානයේ එන විපාක හැටියට කියවෙන 'විපාක ප්‍රත්‍යය' යයි. අපි මේ දක්වා එක්තරා මට්ටමකට ප්‍රත්‍යය ධර්‍මයන් පිළිබඳව අහගෙන අහගෙන ආව. හේතු ප්‍රත්‍යය යෙන් ආරම්භ කරලා දැන් කියාගෙන ඇවිල්ලා සාකච්ඡා කරලා අපි පහුගිය සතියේ මතක් කරේ කර්මය පිළිබඳවයි. කර්මය ප්‍රත්‍යයක් වෙන්නේ කොහොමද කියන එකයි. අද මේ පින්වතුන්ට මතක් කරන්නේ විපාකය කියන්නාවූ ධර්‍මය. කොහොමද විපාක ප්‍රත්‍යය ගැන ඉදිරිපත් වෙන්නේ කියල. අපි පළමුකොටම මේ විපාක කියන වචනේ තේරුම් අරගමු. 'වි පූර්ව ආක්' කියන වචනයෙන් තමයි හැදෙන්නේ. ඒක විපාක - ඒ කියන්නේ - විපාකය කියන්නේ මේරීමට පත්වුනු - පැසුනාවූ - පැහුණු - මෝරපු - ඉදුණු කියන වගේ අර්ථයක් තමයි තියෙන්නේ. යමක් හොඳට ඉදුණම හොඳට මේරුවම හොඳට පැසුණම - අපි හිතමු ගහක ගෙඩියක් පලදාවක් කියල - එතකොට ඒකට සිද්ධ වෙන යම් කිසි දෙයක් තිබෙනවා. හැබැයි මෝරන්නේ නැතිකොට අපි උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම ගහක ගෙඩි හැදෙනවා - අපි ඔය පැහෙනවා මෝරනවා කියන එක පාවිච්චි කරන්නේ එතනයි. ගහක ගෙඩි හැදුනම ඒ ගෙඩි කවුරුවත් කැඩුවේ නැත්නම් ඒ ගෙඩි ඉබේම වැටෙනවා. ඒක ස්වභාවධර්‍මයක්. ඒ ගෙඩි ඉබේම වැටෙන්නේ ඒකට අවශ්‍ය කරන්නාවූ ඕජාව - අවශ්‍ය සම්පත්තිය ගහින් ලැබිල ගහේ ඉන්න පුළුවන් කාලයක් තිබිලා ඊට පස්සේ ඒකට තව දුරටත් ගහේ ඉන්න බෑ. ඉතින් මේ ගෙඩිය මෝරලා මෝරලා පැහිලා පැහිලා අවශ්‍ය කාලය ආපු ගමන් ඒක ගහෙන් වැටෙනවා. සමහර මල් වැටෙනවා. ගෙඩි හැදිලා මේරුවහම ඉදිලා පැහිලා වැටෙනවා. මේක ධර්‍මස්වභාවයක්. මේ වැටීම ධර්‍මස්වභාවයක් - කවුරුත් යන්න ඕන වෙන්නේ නෑ නටුවෙන් කඩල අයින් කරන්න - වෙන් කරන්න.

ඒ වගේ තමයි නා නා ක්ෂණික වශයෙන් - කර්ම ප්‍රත්‍යයේ කථා කරපු නා නා ක්ෂණික කර්මයක් කළහම - වෙනත් අවස්ථාවකදී කල් ඇතුව කරපු ඒ කර්මයේ ස්වභාවය තමයි ඒ කර්මය මෝරනවා. කර්ම කළහම එක පාරම ඒකෙ විපාක දෙන්ට යන්නේ නෑ ප්‍රතිසන්ධි වශයෙන්. ඒක මෝරනවා - මෝරන කොට සමහර කර්ම තියෙනවා ගොඩක් කල් යනවා. සමහර කර්ම තිබෙනවා ඉක්මනටම ඉක්මනටම බණ්ඩක්ක වගේ ඉක්මනටම මෝරලා යනවා. සමහර ඒවා තියෙනවා කල් අල්ලනවා. ඉතින් කොහොම හරි මේ කර්මය ඒ කර්මයේ ස්වභාවයට - ඒ කර්මයේ තරමට - ප්‍රමාණයට කල් ගිහිල්ල මේක මේරුවහම අර ගහෙන් ගෙඩිය වැටෙන්න වගේ කර්මය හින්ද එක පාරම විපාකය මතුවෙනවා. ඒකට අවස්ථාව අවශ්‍ය වෙනවා. පරිසරය අවශ්‍යයයි. එතකොට මොකක් හරි ඒ කරපු කර්මයක කිසිම වෙන කර්මයක සම්බන්ධයක් නැතුව - මේක ඉබේම මතුවෙලා විපාක දෙන්ට එන තත්වයට පත්වෙන කොට කියනවා - ඒ කියන්නේ කර්මයේ තිබෙන්නාවූ ශක්තිය එතනින් නැවත මුදා හරින තත්වයට එනකොට කියනවා 'විපාක' අවස්ථාවයි කියල. අපි දානමය පිංකම් සිද්ද කරනවා - සීලමය පිංකම් සිද්ද කරනවා - භාවනා කරනවා - භාවනාමය පිංකම් - ඉතින් නොයෙක් ආකාරයේ තිබෙන්නාවූ ඒ පිංකම් කරමින් කරමින් ගොඩක් කුසල් වඩනවා. අකුසල් වශයෙනුත් තියෙනවා. දැන් මේ කියන්නාවූ මේ කර්ම ටික - දැන් කර්ම කරන වෙලාවේ යම්කිසි සිතුවිලි ටිකක් - සිතුවිලි සමුදායක් - චෛතසික ධර්‍මයන් එක්ක මතුවෙලා ඒක නැතිවෙලා යනවා. දැන් එතකොට මේ කර්මය කරලා ඉවරයි. කර්මය

කරනවා කියල සිද්ධ උනේ චේතනාව ප්‍රධානව චිත්ත චෛතසික ධර්ම සමූහයක් මතුවෙච්ච එක. ඒක ඉවරයි. හැබැයි ඒ ඉවර උනාට නැතිවෙලා ගියාට මේකේ භයානක දේ තමයි - අර ක්ෂණ නිරෝධයෙන් නිරෝධ උනාට විපාකයත් සම්පූර්ණ නැති කරගෙන නිරෝධ උනේ නෑ. ඒක නිසා ඒ කර්මය යම්කිසි වෙලාවක විපාකයකට පාර හදනවා. ඒ විපාකය පිළිබඳව තමයි අපි මේ කථා කරන්නේ.

දැන් මේ විපාකය දෙනකොට අපි හඳුනා ගන්ට ඕනේ එකක් තියෙනවා. ඒක හරියට දැනෙනවා අඩුයි කියනවා. විපාකයේ දැනීම අඩුයිලු. ඒක ශාන්තයි කියල කියන්නේ. ශාන්ත වූ උත්සාහ භාවයක් නැත්තාවූ ශාන්ත වශයෙන් පවතින උත්සාහ ස්වභාවයක් ගැම්මක් ගැනීමක් නැති ගතියක් තියෙනවා විපාකයේ. ඒ විපාකය තේරුම් ගන්ට කර්මය ටිකක් හිතන්ට වෙනවා. කර්මයක් කරනකොට යම්කිසි ගැම්මක් අවශ්‍යයයි. යම්කිසි හයියක් අවශ්‍යයයි. යම්කිසි වීර්යයක් දාන්න අවශ්‍යයයි. වීර්යයක් ගැම්මක් හයියක් යොදන්න ඕන කර්මයක් කරන කොට. ඒකට කියනවා උත්සාහවත්බව කියල. ශක්තිය යෙදීම - ඒ කර්මය කරනකොට - කුසල හෝ අකුසල. විපාකය එනකොට - ඒ කර්මයට දාන තරම් හයියක් - කර්මයට දාන තරම් ශක්තියක් - උත්සාහයක් අවශ්‍ය නෑ. ඒක අපිට තව මේ විදියට තේරුම් ගන්ට පුළුවන්.

මනුෂ්‍යයෙක් ගලක් උඩට දානවා. ගලක් අරගෙන ගැම්ම අරගෙන හයියෙන් ගල ගැම්මට උඩට වීසි කරනවා. එතකොට ඒ ගල උඩට යනවා. ගල උඩට යන්න - ඒ ගල වීසි කරන්ට එයා ගල අරගෙන හොඳට ගැම්ම අරගෙන අතින් ගැම්ම දාල වීසි කරන්න ඕනේ. ඒ ගැම්ම දාල ගලක් වීසි කරහම ඒ ගලට දීපු ශක්තියට අනුකූලව මේක යම්කිසි ප්‍රමණයක් හොඳට යනවා. උඩට ගිහිල්ල යම්කිසි තැනකදී නැවතිලා ආපහු පල්ලෙහට එනවා. දැන් එතකොට පාර වෙනස් උනා. ඉස්සෙල්ලා උඩට ගියා. දැන් පහළට එනවා. පහළට එනකොට ඒ ගල පල්ලෙහට එන්න තල්ලු කරන්ට කිසි කෙනෙක් උඩ ඉන්න ඕනේ නෑ. දැන් මේ ගල යම්කිසි වේගයකින් උඩට ගියානේ. ගිහිල්ල ඒක ඉබේම ආපහු හැරිලා පල්ලෙහට එනවා - ඒ වැඩේ කරන්න කිසිම ශක්තියක් - කිසිම උදව්වක් - කිසිම උපකාරයක් අවශ්‍ය නෑ. ඒක නිරුත්සහායක ගලා යෑමක්. නිරුත්සාහක - ශාන්ත පල්ලෙහාට වැටීමක්. ගහක ගෙඩියක් හැදුනම ඒ ගෙඩිය තියෙන කාලයක් ගහේ තිබිල නිරුත්සාහයකින් - වෙන කෙනෙකුගේ මෙහෙයවීමක් නැතුවම ස්වභාවයෙන්ම ශාන්තව ඒක වැටිලා යනවා. දැන් මේ විපාකයත් ඔන්න ඔය වගේ. විපාකය කියන එකත් හරි අමාරුයි දැන ගන්ට. ඒතරම් ඉතාම සියුම්. කිසිම උත්සාහයක් නැතුව සිදුවෙන දෙයක්. ශාන්තව සිදුවෙන දෙයක්.

දැන්මේ කථාව කියනකොට අපිට අපේ ඔය භාවනා කරන අය ඒවාගේම ඔය ආයතන භාවනාව කරන අය කරන සහ ඉන්න යම්කිසි මුලාවක් මතුවෙනවා. අපි ඒකට යමු මෙහෙම - ඉස්සරවෙලා යන් ප්‍රධාන විපාකයට. ප්‍රධාන විපාකය කියල කියන්නේ භවාංග සිත. මේ

භවාංග සිත් හරි ශාන්තව තියෙන්නේ. හරිම ශාන්තව භවාංග ධාරාවක් - පෙර කරන ලද යම්කිසි කුසලයක විපාකයක් හැටියට පුදුම විදියේ භවාංග ධාරාවක් යනවා - ඒක විඳින්ට පුළුවන් - හරි ශාන්තයි - දැනෙන්නේ නෑ. නින්දේ ඉන්නකොට අපි කොහොමද හිටියේ මොන විදියටද හිටියේ කියල අපිට නැගිට්ටම හිතා ගන්න බැනේ. ඒ තරම් සියුම්. හීනයක් දැක්කොත් විතරයි මතක හිටින්නේ. ඒකත් ලොකුවට මතක් වෙන හීනයක් එහෙම නැත්නම් ඒකත් ඒ තරම් හයියට මතක නෑ. හැබැයි භවාංග ධාරාවේ - ඒක විපාක සිත් පෙළක් නිසා ඒ විපාක සිත් පෙළේ තිබෙන ශාන්ත ගතිය අපිට ඒක ඇතුලේ ඉන්දෙද්දී වින්දට හරි ශාන්තව යන්නේ මේක - උත්සාහයක් නැතිවම  ගලාගෙන ගලාගෙන යනවා හැබැයි ඒකෙ තිබ්බ්ච ගතියක් මොනවා හරි තියෙනවානම් අපිට ඇහැරුනාට පස්සේ එක්තරා විදියකට මතකයක් තිබෙනවා නමුත් හරියටම මේකයි කියල එහෙම අල්ලගන්ට බෑ. ඒක නිසා මේ විපාක සිතේ ඔය ශාන්තව ලාවට සියුම්ව ගලාගෙන යන ගතියක් තියෙනවා - ප්‍රසිද්ධ නෑ.

ඇස කන නාසය දිව ශරීරය කියන ආයතන 5 ට අරමුණු හමු උනහම ඒ අරමුණු ග්‍රහණය වෙනවා. ඇත්තවශයෙන්ම ඔය චක්ඛු විඤ්ඤාණයෙන් තමයි දර්ශනය  සිද්ද වෙන්නේ - සෝත විඤ්ඤාණයෙන් සද්ද ඇසීම - ඝාන විඤ්ඤාණයෙන් ගඳ සුවඳ දැනගැනීම - දිවෙන් රස දැනගැනීම - ශරීරයෙන් ස්පර්ශය - හැබයි මේවා හරිම සියුම්. මම අහල තියෙනවා මටත් සමහර අය කියලත් තියෙනවා රූපය   ඇහේ වදින කොටම - ස්පර්ශ වෙනකොටම දැනෙනවයි කියල. ‘ඒතරමට සියුම්ව මට දැනෙනවා’ ‘ස්පර්ශ වෙනකොට දැනෙනවා’ ‘ස්පර්ශ වෙන රූපය අහුවෙන කොටම - චක්ඛු විඤ්ඤාණය පහළ වෙනකොටම දැනෙනවා’ කියල. ඕක මහා බොරුවක්. ඒක වෙන්නේ නෑ. වෙන්නේ නැත්තේ ඒක ඒ තරම්ම සියුම්. ඕක විපාක සිතක්. විපාක සිතක් පහළ වෙන වෙලාවේ ඒ හරියෙම තව ඕක බලන හිතක් පහළ වෙන්නේ නෑ.

ඔය කියන්නේ චක්ඛු විඤ්ඤාණ මහා රැළි - ලක්ෂ ගානක් ගියහම ඒක මනසෙත් හැප්පිලා ඔය සිද්ද වෙන එකේ අවසාන වලිගෙ හරියෙන් අල්ල ගත්ත ටිකක් වැටහෙන එකට තමයි ඔය බොහෝ අය  කියන්නේ. ‘මට හැපෙන කොටම දැනෙනවා සපර්ෂ වෙනවා’ කියල. ඒ කියන්නේ ඒ තරමටම මේ විපාක සිත අල්ලන්ට බෑ.  ඒ සිත හරි සියුම් - ඒ සිත හරිම නිරුත්සාහක ශාන්ත ස්වාභවයෙන් යන්නේ. ඒක නිසා මේ විපාක සිතේ තිබෙන්නාවූ ඒ ශාන්ත භාවය අපි පළමු කොටම තේරුම් ගන්න ඕන. අනිත් එක තමයි විපාක සිතක් පහළ වෙනකොට සමහර විපාක සිත් රූප හදනවා – විපාක සිත නිසා රූප පහළ වෙනවා. සමහර විපාක සිත් වල  ඒක වෙන්නේ නෑ. එතකොට සිත පහළ වෙනවා -  චෛතසික ධර්‍ම පහළ වෙනවා පොකුරට. ඒ පහළ වෙන කොට එක තැනකදී ඒ අදාල රූප නිෂ්පාදනය වීම සිද්ධ වෙනවා සමහර ඒවගේ. හැබැයි හැම එකේම පහළ වෙනවා කියල හිතන්න හොඳ නෑ. අපි උදාහරණයක් හැටියට ගියැන් පස්සේ - නිතර නිතර මේක කියන එක හොඳයි - එතකොට අපේ පින්වතුන්ට ඒක තහවරු වෙනවා හිතට. ප්‍රතිසන්ධි සිත කියල කියන්නේ ජීවිතියේ

ආරම්භක විපාක හිතක්. ජීවිතය ආරම්භ කරන්නෙම විපාක හිතකින්. ඒ විපාක හිත කියන ප්‍රතිසන්ධි සිත මේ ජීවිතයේ කරපු කර්මයක් හින්ද නෙමෙයි - ඊට ඉස්සෙල්ල කරපු කර්මයක් හින්ද. මේ ජීවිතයට කලින් කරපු කර්මයක් හින්ද තමයි ප්‍රතිසන්ධිය මෙතන හැදෙන්නේ. ප්‍රතිසන්ධිය කියන හිත එන කොටම ඒකෙ තිබෙන ගැම්ම හින්ද ඒකෙ තියෙන ශක්තිය හින්ද පහළ වෙනවා කර්මයට සම්බන්ධ - කර්මයෙන් හදන රූප. අන්න බලන්න එතැනදී විපාක සිතට අනුකූලව විපාක සිතත් සමගම කර්මජ රූප පොකුරක් හැදුන. ඒ කර්මජ රූප පොකුර ගැටගහගන්න මතුකරල දෙන ගතිය තියෙන්නේ අර විපාක හිතේ. හැබැයි එතනදී චිත්තජ රූප එන්නේ නෑ කියල අපි කිව්වා. පංචවෝකාර භවයක කෙනෙක් ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේදී චිත්තජ රූප පහළ කරන්නේ නෑ. ප්‍රතිසන්ධි කර්මජ රූප පහළ කරනවා. ඊළඟට දෙවෙනි හිතේ ඉඳල දිගටම නැවත කර්මජ රූප පරම්පරාවත් අලුතෙන් චිත්තජත් දෙකම හදනවා. එතකොට විපාක සිතක තිබෙනවා කර්මජ රූප හදන ගතියයි චිත්තජ රූප හදන ගතියයි දෙකම ඒකෙ තියෙනවා. එතකොට මේ විපාක සිත කියන එක අමුතුම මහ පුදුමම ධර්ම ශක්තියක්. සමහරවෙලාවට දැනිල ඇති අපේ හිත්වලට නවත්වන්ට බැරි සිතුවිලි එනවා. ඒකියන්නේ නවත්වන්ට බැරි දේවල් සිද්ධ වෙනවා - අපි ඒකට අකමැති උනාට ඒක ඇතුලේ ඉඳගෙන උඩට තල්ලු කරලා - තල්ලු කරලා දෙනවා වගේ තියෙනවා. ඕක අස්සේ තියෙනවා කර්ම සම්බන්ධයක් - කර්ම සම්බන්ධතාවයක් තිබෙනවා. සමහරවිට නවත්වා ගන්ට ආමාරුයි. හෝ ගාල එන ගතිය තියෙනවා. එතකොට ඒක අපිට දැනෙන්නේ ඒකත් එක්ක අර රණ්ඩුවෙන තත්වයට යනකොට. ඒකත් එක්ක රණ්ඩුවෙනවා වගේ එහෙමත් නැත්නම් තදින් හිත ගොරෝසුවට අල්ලන හරියෙන් තමයි අපිට ඕක දැනෙන්නේ. හැබැයි ඕක පහළ වෙනකොට නවත්වා ගන්න බැරි ඒ විපාකය පාලනය කරන්න බැරි නිසා. අන්න ඒ වගේ.

දැන් මේ විපාක කියල කියන්නේ ප්‍රත්‍යය ධර්මයක් අද මේ කථා කරන මාතෘකාවට අනුකූලව. විපාකය කියන්නේ ප්‍රත්‍යය ධර්මයක්. ප්‍රත්‍යය ධර්මය කියල කියන්නේ මොකකට හරි උපකාර වෙනවා කියන එක. අපි බලමු මොකකටද උපකාර වෙන්නේ කියල. විපාකයේ තිබෙනවා ප්‍රත්‍යය වෙන - තවත් එහෙකට උපකාර වෙන - උදව් වෙන යම්කිසි ශක්ති විශේෂයක් - ගුණ විශේෂයක්. එතකොට මේ විපාකය කියන එක තියෙන්නේ - අපි කියනවා විපාක සිත් කියල - විපාක සිතක් පහළ උනා කියල - හැබැයි විපාක සිතක් කියල කිව්වට ඒක විපාක සිතම නෙමෙයි. විපාක සිත සමග එකතුවෙන - විපාක සිත සමග මතුවෙන විපාක චෛතසික ටිකක්. සිත විතරක් විපාක වෙලා චෛතසික නොවී තියෙන්නේ නෑ. විපාක සිත වගේම චෛතසිකත් විපාකයි. උදාහරණයක් ගත්තොත් චක්ඛු විඤ්ඤාණ සිතේ ඒ චක්ඛු විඤ්ඤාණය කියන ඒ 'විඤ්ඤාණය' විපාකයක්. ඒ චක්ඛු විඤ්ඤාණය විපාකයක් වෙනවා වගේම ඒකෙ අස්සේ තිබෙන 'ඵස්ස' 'වේදනා' 'සංඥා' 'චේතනා' 'ඒකග්‍රතා' 'ජීවිතේන්ද්‍රිය' 'මනසිකාරය' කියන සර්වචිත්ත සාධාරණ චෛතසික සමූහයත් විපාකයි. එතකොට මේ විපාක ධර්ම 8 ක් තියෙනවනේ. මේ විපාක ධර්ම 8 ඔවුනොවුන්ට උදව් වෙනවා. සිත චෛතසික 7 ට උදව් වෙනවා. ඒ චෛතසික 7 මේ සිතට උදව් වෙනවා. චෛතසික ධර්මත් ඔවුනොවුන්ට

උදව් වෙනවා. එතකොට මෙතැන තියෙන්නේ අන්නෝන්‍ය වශයෙන් විපාක ස්වභාවය ප්‍රත්‍යය වෙන ගතියක්.

කාලෙකට ඉස්සෙල්ලා මම දැකල තියෙනවා වැඩසටහනක ප්ලේන් වලින් ගිහිල්ල මිනුස්සු Parachute වලින් පනිනවා. එතකොට Parachute එකේ පල්ලෙහට එනකොට සමහර තැන්වලදී දෙන්න දෙන්න එනවා සමහර තැන්වලදී රංචු එනවා - හතර පස් දෙනා එකට අත් අල්ලගෙන එනවා. මට ඕනකම තිබුන මේ මිනුස්සු මේක කරන්නේ කොහොමද කියල හිතන්න. සමහර අවස්ථාවලදී ඒ පුහුණු කාරයෝ නුපුහුණු අය අරගෙන යනවා. අරගෙන ගිහිල්ල දෙන්න අත් අල්ලගෙන පැන්නම ඒ එන අතරවාරේ - දැන් කවුරුවත් තල්ලු කරන්නේ නැනේ උඩ ඉඳල පල්ලෙහට එන්න. ඉතින් ඒ අතරවාරේ අර පුහුණුව නැති එක්කෙනාට උදව් කරනවා සමහර වෙලාවට දෙන්න ඔවුනොවුන් අතින් අල්ල ගන්නවා - ඒවගේම කෙනෙකුට සංඥා දෙනවා. ඕව කරකර තමයි එන්නේ. දැන් මේ පල්ලෙහට එන ගමන් ඔවුනොවුන්ට ප්‍රතිචාර දක්වනවා. සමහර විට කථා කරනවා. සමහර විට හස්ත සංඥා දෙනවා. ආන්න ඒ වගේ. මේ විපාකයක් කියන හිත මතු උනහම ඒ විපාක හිතේ තිබෙන්නාවූ චෛතසික ධර්‍ම එක එක්කෙනාට උදව් කරගන්න ස්වභාවයක් තියෙනවා. ඒ උදව් කිරීමත් හරිම නිස්කලංකව හෙමිහිට ඔවුනොවුන්ට දැනෙන්නේ නැතුව වගේ කරගන්න ගතියක් - ඒවගේ සිදු වෙන ස්වභාවයක් තිබෙනවා.

ඒක නිසා හැම විපාක හිතකම තියෙනවා ප්‍රත්‍යය ගතිය - ඒ හිත්වල තිබෙන්නාවූ චෛතසික ධර්‍ම වලත් තිබෙනවා විපාක ප්‍රත්‍යය ගතිය. ඒවගේම ඒ විපාක ස්වභාවය - 'සිත සහ චෛතසික' චිත්තජ රූප හදන්නත් ප්‍රත්‍යය වෙනවා. අර හිත සහ චෛතසික ධර්‍ම ඔවුනොවුන්ට උදව් කරගන්නවා වගේම තමගේ group එකේ නැත්තාවූ තමන්ට නෑ කමක් කියන්නේ නැත්තාවූ චිත්තජ රූප - රූප කියන්නේ නාම ධර්‍ම නෙමෙයිනේ - නමුත් වෙනත් වර්ගයක රූප ධර්‍මයක් උපදවන්ටත් ඒක උදව් වෙනවා - ප්‍රත්‍යය වෙනවා. උපදින වෙලාවේදී කර්මයෙන් හදන ප්‍රතිසන්ධි රූප හදන්ටත් උදව්වෙනවා. ඒක නිසා මෙතැන තිබෙනවා ඒ විපාක වල ඔවුනොවුන්ට උදව් කරන ගතියක් හැබැයි කවදාකවත්ම 'රූප' 'නාම' වලට උදව් වෙන්නේ නෑ.

විපාක සිත් තිබෙනවා 36 ක්. ඒකත් අපි ඇත්ත වශයෙන්ම මතකයේ හැටියට දැනගන්න එක හොඳයි. විපාක සිත් හැටියට සලකනවා 36 ක්. චෛතසික ධර්‍මත් 38 ක් සලකනවා. ඒක වෙන්නේ කොහොමද කියල බලමු. අපි සිත් පිළිබඳව කථා කරන කොට සිත් 89 ගත්තම සිත් 89 න් බෙදනවා කුසල සිත් කොටසක් -අකුසල සිත් කොටසක් ඊළඟට විපාක සිත් කොටසක් - ක්‍රියා සිත් කොටසක් කියල ගොඩවල් 4 කට බෙදනවා. මේ ගොඩවල් 4න් (කුසල - අකුසල - විපාක - ක්‍රියා) 36 තිබෙනවා විපාක හැටියට සලකන. ඒ 36 තමයි

- අහේතුක සිත් 18 තුල සිත් 15 වක්ම විපාකයි ( අකුසල විපාක සිත් 7 + කුසල විපාක සිත් 8)
- කාම සෝභන සිත් 8 - ඒවත් විපාකයි

- රූපාවචර සිත් 5 යි - ඒවත් විපාකයි
- අරූපාවචර සිත් 4 යි - ඒවත් විපාකයි

කාම සෝභන විපාක 8 යි + රූපා වචර විපාක 5 + අරූපා වචර විපාක 4 = 17 + අහේතුක සිත් 15 = 32

මේ විපාක සිත් 32 ට ලෝකෝත්තර සිත් 4 ( ඒවත් ඇත්ත වශයෙන්ම විපාක - මාර්ගයෙන් අනතුරුව පහළ වෙන්නේ. මේවා අනිත් සිත් වගේ උප්පත්ති පතිසන්ධි ලබාදෙන විපාක නෙමෙයි. මේවා මාර්ගයෙන් අනතුරුව පහළ වෙන විපාක සිත් ) එකතු කරහම ඔක්කොම විපාක් සිත් 36 ක් වෙනවා.

කාම - රූප - අරූප - ලෝකෝත්තර කියන භූමි 4රේ - ඔය විපාක සිත් 36 ඇතුලේ අවස්ථානුකූලව වැඩ කරනවා - ක්‍රියාත්මක වෙනවා චිත්ත ගති හෙවත් චෛතසික ධර්ම සමූහයක්. ඒවා සියල්ල 38 ක් වෙනවා. ඉතින් මේ රංචුව තමයි ඔවුනොවුන්ට විපාක වශයෙන් ප්‍රත්‍යය වෙවී ප්‍රත්‍යය වෙවී - ඒ කියන්නේ එක්කෙනෙක් ඒ වෙලාවේ ඒ මොහොතේම ප්‍රත්‍යය වෙනවා වගේම අනිත් එක්කෙනා ප්‍රත්‍යය උප්පන්න වෙනවා. තමන් ප්‍රත්‍යය වෙනවා තවත් එහෙකට ඒවගේම අනිත් එක්කෙනා තමාට ප්‍රත්‍යය වෙනවා. මේ විපාක ප්‍රත්‍යය වීම මෙහෙමත් හිතන්න පුළුවන්. මේ විපාක ප්‍රත්‍යය වීම මේසයක කකුල් 4 වගේ. මේ මේසයේ කකුල් 4 මේසයේ තිබෙන්නාවූ ලෑල්ලේ බර සමව දරාගෙන ඉන්නේ. ඒ එක මේස කකුලකට උපකාරයක් ලබනවා ඒ වෙලාවේ අනිත් තුන් දෙනාගෙන් - ඒක නිසා එක මේස කකුලකට වැටෙන්නේ නෑ සම්පූර්ණ බර. අනිත් තුන්දෙනාගෙන් උදව්වක් හම්බ වෙනවා. එතකොට තුන්දෙනෙකුගෙන් උදව් ලබාගෙන තමන් ඒ තුන්දෙනාට අනිත් කකුල් තුනට තමන්ගෙන් උදව්වක් කරනවා. එක කොටසක බර තමන් දරනවා. එතකොට එක වෙලාවේම මේස කකුලක තිබෙනවා ප්‍රත්‍යයක් අනිත් මේස කකුල්වලට බර අඩු කිරීමටත් එව්වාගෙන් තමන් උපකාරයක් ලැබීමත්.

දැන් අපි පාදෙක සමව තියාගෙන හිටගෙන හිටියොත් ඔතන වෙන්නෙත් ඕකයි. පාදෙක සමව තියාගෙන හිටගෙන ඉන්න කොට අපේ ශරීරයේ තිබෙන්නාවූ බර පාදෙකම සමව දරාගෙන ඉන්නවා. එතකොට මේ එක පාදයකට අනිත් පාදයෙන් උදව්වක් ලැබෙනවා. හේතුව තමන්ගේ ඇඟට එන්නෙ නෑ - තමන්ටම ඒ බර දරන්නට අවශ්‍ය නෑ. වම් පාදය - අනිත් පාදය ඒකෙ කොටසක් දරාගෙන ඉන්නවා. එතකොට උදව්වක් - ඒවගේම ඒ වම් පාදයත් දකුණු පාදයෙන් තිබෙන උදව්ව ලබනවා. එයාට ඒ වෙලාවේ අර දකුණු පාදය ශරීරයේ බර ටිකක් දරන නිසා එයාට වගකීම එන්නේ නෑ. එතකොට එක වෙලාවේම ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙන ගතියක් තිබෙනවා. උදව් කර ගන්නව - උදව් ලබනවා. අන්න ඒ වගේ චිත්ත චෛතසික ධර්මයෝ එක වෙලාවේම රූපයන්ටත් එක්ක උදව් කරනවා ඒවගේම අනිත් අය උදව් ලබනවා. රූපයන්ගෙන් විතරක් උදව් ලබන්නේ නෑ.

එතකොට අපි දැන් කිව්වා ප්‍රත්‍යය ධර්ම වෙන්නේ ඒ චිත්ත චෛතසික ධර්මයෝ ටිකමයි - ප්‍රත්‍යය උප්පන්න ධර්ම වෙන්නේ ඒ චිත්ත චෛතසික ධර්මයෝ ටිකමයි රූපත් එක්ක. එතනදී

එකක් තිබෙනවා ප්‍රත්‍යය උප්පන්න ධර්‍ම කියනකොට 'සිතයි' 'චෛතසික ධර්‍ම සමූහයයි' 'රූපයි' ඔක්කොම ටික ගන්න ඕනෑ - 'කර්මජ රූප' සහ 'චිත්තජ රූප ටික'.

දැන් තව එකක් තිබෙනවා. ඔය පට්ඨානය ඉගෙන ගන්න කොට එක තැනක එනවා 'විස්සජ්ජනා වාරය' කියල එකක්. විස්සජ්ජනා කියල වෙන විදියකට කියනව පේළි ගතකරනවයි කියල. ඒ කියන්නේ වීථි ගත කරනවා - පේළි ගතකරනවා කියල. විස්සජ්ජනා වාරයේ මේ විදියට කියනවා.

**'අව්‍යාකෘත ධර්‍මයක් අව්‍යාකෘත ධර්‍මයකට විපාක ප්‍රත්‍යය ගුණයෙන් උපකාර වෙනවයි කියල'**. එතකොට පාලියෙන් කියන්නේ මෙහෙමයි -

**'අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතසස ධම්මසස විපාක පච්චයෙන පච්චයො'** = 'අව්‍යාකෘත ධර්‍මයක් අව්‍යාකෘත ධර්‍මයකට විපාක ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියල'

මේ අව්‍යාකෘත වචනය මම කියල දුන්නා. ඒ තමයි අපි කථාකළා කලින් තික මතිකාවේ ආරම්භය. ඒ තික මතිකාවේ ආරම්භයේ කරුණු තුනක් තියෙනවා. පළවෙනි මාතෘකා තුන ) = **කුසලා ධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා.**

අව්‍යාකෘත කියල කියන්නේ කුසලත් නොවන අකුසලුත් නොවෙන්නාවූ ධර්‍ම ටිකයි. දැන් හොඳට බලන්න. මීට ටිකකට කලින් මම මේ පින්වතුන්ට මතක් කරා ඔක්කොම සිත් ටික - ධර්‍ම ටික ගොඩවල් හතරකට කැඩී යනවා. මොකක්ද? කුසල අකුසල විපාක ක්‍රියා යනුවෙන් ගොඩවල් හතරකට වෙන් වෙනවා. එතකොට මේ කුසල අකුසල විපාක ක්‍රියා යන හතර තික මතිකාවට දැම්මොත් එහෙම - මාතෘකා තුනේ කථා කරොත් අකුසල් 12 යි කුසල සිත් ටිකයි වෙන් කර ගත්තහම අනිත් ටික ඉතුරු වෙනවනේ - එනම් ක්‍රියා සිත් 20 කුත් විපාක සිත් 36 කුත්. මේ ධර්‍ම 56 ට කියනවා අව්‍යාකෘත ධර්‍ම කියල. ඒ කියන්නේ විපාක සිත් ටිකත් අව්‍යාකෘතයි ක්‍රියා සිත් ටිකත් අව්‍යාකෘතයි.

**ක්‍රියා සිත් 20 + විපාක සිත 36 = 56 ( අව්‍යාකෘත ධර්‍ම)**

මේ කථාව කියන කොට මෙතැනදී ගණන් ගන්නේ විපාක අව්‍යාකෘතයයි. ක්‍රියා අව්‍යාකෘතත් තිබෙනවා විපාක අව්‍යාකෘතත් තියෙනවා.

**'අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතසස ධම්මසස'** - දැන් එතකොට මේක අව්‍යාකෘත ධර්‍මයකනේ - මේ විපාක සිත සහ විපාක චෛතසික ධර්‍ම ටික. ඒ ටික අනිත් ඔය එතනම ඉන්නාවූ විපාක වශයෙන් තිබෙන්නාවූ අව්‍යාකෘත ධර්‍මයන්ට චෛතසිකයන්ට රූප වලට ප්‍රත්‍යය වෙනවා කියන එකයි. එතකොට ප්‍රත්‍යය උප්පන්න වශයෙන් ඔවුනොවුන්ට ඒ ප්‍රත්‍යය ලබා ගන්නවා - ලබාගෙන පහළ වෙනවා.

දැන් මම මේ වෙලාවේදී මේ පින්වතුන්ට අද මෙච්චරයි කියන්නේ. මේ විපාක ප්‍රත්‍යයයේ තිබෙන්නේ බොහොම කෙටියෙන් නමුත් ඒක ‘බන්ධ’ වචනයෙන් පාවිච්චි කරන්නේ - මම ඒක පාවිච්චි කරන්නේ නැතුව මම මේ පින්වතුන්ට කිව්වේ. මේ ටික තේරුම් ගත්තොත් හොඳයි - මේ විපාකය කියන එක කාගෙවත් මෙහෙයවීමක් නැතුව උදව්වක් උපකාරයක් නැතුව අවස්ථාව හැදුනහම අවස්ථාවට අනුකූලව හරියට ඒකෙ විපාකය ඉදිරිපත් කරනවා. අවස්ථාව පරිසරය ඒකට අවශ්‍යයයි. ඒකියන්නේ දැන් අපි මීට කලියෙන් කොහේ හෝ වේවා ජීවිතයක හෝ මේ ජීවිතයේ යම් යම් මුල් අවස්ථාවලදී කුසල වශයෙන් අකුසල වශයෙන් කර්ම සිත් හදල තිබෙනවා. කුසල් වශයෙන් කර්ම හදල තිබෙනවා අකුසල වශයෙන් කර්ම හදල තිබෙනවා. මේවා හදපු හදපු - හදපු හදපු තැන් වලම මුල් ගැහිලා යට ගැහිලා ගියා. ඒවෙලාවේම කර්ම ශක්ති හදල මුල් ගැන්විලා ඒ වාගේම යට වෙලා ගියා. හැබැයි ඒවා එහෙමම තියෙනවා. හැබැයි කොතන තියෙනවද කියන්න බෑ. දැන් සමහර කොටසක් කියනවා ඕක අහසේ තියෙනවා කියල - ඒ කියන්නේ අහසේ තිබිලා අපිට එනවා කියල. තේරුම් ගන්න බැරි හින්ද එක එක මති මතාන්තර සිතෙන සිතෙන ජාති කියනවා. නමුත් මේක කොහේ හරි චිත්ත පරම්පරාවට සම්බන්ධ වෙලා ඔහේ මොකක් හරි ශක්ති විශේෂයක් හැටියට තියෙනවා. ඒක ගොනුකරලා නාම ධර්‍මයක් හැටියට සලකන්න බෑ. ඉතින් මේ තියෙන්නේ කර්ම සිත් සහ කර්ම චෛතසික ටික. ඒ ටික ඒ වෙලාවේම පහළ වෙලා නැතිඋනා - දැන් එනකම් බලාගෙන ඉන්න වෙන්නේ විපාක ටිකනේ. හැබැයි විපාක සිත් පහළ වෙනකොට අර පරණ තිබුනාවූ කර්මයේ බලය පරණ තිබුනාවූ කර්ම චිත්තයේ ඒ හැඟවීගිය බලයෙන් මෙතැන පරිසරයට අනුකූලව නැවත ‘විපාක සිත් ටිකකුයි’ ‘විපාක චෛතසික ටිකකුයි’ ‘විපාක රූප ටිකකුයි’ තමයි පහළ කරන්නේ. ඒක අහසෙද - ඒක පහළ කරන්නේ පොළොවෙද - ඒක පහළ කරන්නේ මනුෂ්‍ය ලෝකෙද - ඒක පහළ කරන්නේ මවු කුසක් ඇතුළතද - එහෙම නැත්නම් මවු කුසෙන් පිටද - දිව්‍ය ලෝකයේද - කොතනද කියල දන්නේ නෑ. යම්කිසි තැනක පරිසරයක් හැදුනාද - යම්කිසි තැනක රූප වශයෙන් හෝ වේවා චිත්ත චෛතසික වශයෙන් හෝ වේවා පරිසරයක් ගොනුවෙච්ච ගමන්ම අර පරණ තිබෙන ටික ඔක්කෝම එතෙන්ට ඇදගෙන එනවා. ඒකනිසා තමයි සමහර විපාක තිබෙනවා එන්ට බැරිව සිර වෙලා තිබෙනවා. අවස්ථාව ගැලපෙන්නේ නෑ. දැන් දිව්‍ය ලෝකයේ ඉපදුනහම කෙනෙක් එතැනදී ඒ පරිසරයට අනුව විපාක සිත් පහළ කරන්ට -විපාක චෛතසික හදන්ට - විපාක රූප හදන්ට ගොඩක් කර්ම පහළ වෙලා තියෙන්නේ. ඒක පහළ වෙන්ට පරිසරය ඕනෑ - දැන් පරිසරය නොවෙයි මනුෂ්‍ය ලෝකේ. යම්කිසි විදියකින්වත් තිරිසන් ලෝකේ ඉපදුනොත් එහෙම තිරිසන් ලෝකේ තිරිසන් ශරීර කායික පරිසරයකට අනුකූලව ඒ තිරිසන් ලෝකයේ තිබෙන්නාවූ විපාක සිතට අනුකූලව ගොඩක් දුක් ගැහැට විපාක ගෙන දෙන්ට පුළුවන් විදියේ කර්ම එක්කාසුවක් තියෙනවා. ඒක ඒ පරිසරයට ගිය ගමන්ම චිත්ත චෛතසික හදල හදල දානවා - පරිසරය ගැලපෙනවා ඒ ටික මතුවෙන්ට. ඒකනිසා දැන් මේ විපාක නිරුත්සාහක ශාන්ත ස්වභාවයෙන් යුක්තව උඩට ඉලිප්පිලා - ඉලිප්පිලා එන්ට බලාගෙන ඉන්නේ. දැන් ඒ එනවයි කියල කියන්නේ මොකක්ද? - කවුරුවත් විදින එකක් නෙමෙයි - තිබෙන්නේ විපාක සිත් ටිකක් පහළ උනා - විපාක චෛතසික ටිකක් ඒ එක්කම පහළ උනා - ඔවුනොවුන්ට ප්‍රත්‍යය වීම වශයෙන් රූප ටිකක් පහළ උනා - එච්චරයි සිද්ධ වෙන්නේ.

මම මේ ටික මේ පින්වතුන්ට මේ වෙලාවේ මේ ප්‍රමාණයෙන් නවත්වනවා. මේ කර්මයක් කළායින් පස්සේ විපාකක් හැටියට උත්පාදනය වෙන්නාවූ - විපාකයක් හැටියට මතු වෙන්නාවූ චිත්ත චෛතසික රූප ධර්ම පිළිබඳව තමයි අද මේ ප්‍රත්‍යය කථාවෙන් - විපාක ප්‍රත්‍යයෙන් කියල දුන්නේ. මීට අමතරව මේ පින්වතුන්ට මේ සම්බන්ධයෙන් තවත් හාරලා අවුස්සලා දැනගන්ට ඒ වාගේම ඇත්නම් - ඒවාගේම ඒ පිළිබඳව ප්‍රශ්න කරන්ට අපි අවස්ථාව සලසා දෙමු. අපේ පිනවතුන් ප්‍රශ්නයක් ඇහුවොත් එහෙම ඒකත් ගොඩක් උදව් වෙනවා උපකාර වෙනවා අනිත් කට්ටියට තේරුම් ගන්න.

අපි මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. බුදුරජාණන්වහන්සේ විස්තරාත්මක විදියට මේ පට්ඨාන ධර්මය දේශනා කරලා තිබෙනවා. හැබැයි දෙවියන් මුල් කරගෙන දෙසන්නේ. මනුස්සයන්ගෙත් ඥානවන්ත ඒකට හිත තිබෙන්නාවූ අවබෝධ කරගැනීමට ප්‍රඥාව ඥානය තිබෙන්නාවූත් අයවලුන්ට පමණක් ග්‍රහණය කරගන්ට පුළුවන්. ඉතින් ඒ පිරිසක් තමයි මේ උත්සාහ කරන්නේ මේක දැනගන්ට. ඉතින් ඒ බුදුරජාණන්වහන්සේ දේශනා කරපු පට්ඨාන ධර්මයේ - ධර්ම මාලාවේ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් අතුරෙන් තවත් එක ප්‍රත්‍යය ධර්මයක් වෙන 14 වෙනි කොටස තමයි අපි මේ කථා කරන්නේ විපාක ප්‍රත්‍යය හැටියට. ඉතින් මේකේ තව තියෙන දේවල් ප්‍රශ්න කිරීම් වශයෙන් සහ ඒවා ආශ්‍රයෙන් දැනගන්ට මහන්සි ගනිමු. සැම දෙනාටම මේ උතුම් ධර්මයේ ආනුභාව බලයෙන් ශක්තියෙන් හොඳින් තව තව ගැඹුරින් මේ ධර්ම මෙනෙහි කරලා අවබෝධ කරගෙන - ඒවාගේම හේතු ඵල ධර්ම කථාවක් මේ කරන්නේ - හේතු ඵල ධර්ම කථාව යම්කිසි තැනක ඇත්ද එතන සංසාරය තියෙනවා. මේ හේතුඵල ධර්මයන්ගේ තිබෙන්නාවූ භයානක තත්වය - ඔවුනොවුන්ට උදව් උනාවූ උපකාර උනා කියල කියන්නේ ධර්ම වශයෙන් කරාට මේක සංසාරය කොටුකරගන්න එකක්. ඒකනිසා මේ සසර දුකෙන් මිදිලා නිවනින් සැනසෙන්ට මේ ධර්මය ඒකාන්තයෙන්ම හේතු උපනිශ්‍රය වේවා! ඒවාගේම බණ ඇසූ පින සැම දෙනාටම නිවන් අවබෝධ කරගන්ට හේතු වාසනා වේවා කියල මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ගෞරවණීය ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට නමස්කාර වේවා! ස්වාමීන්වහන්ස තව පොඩ්ඩක් විපාක මේරීම ගැන දැන ගන්ට ඕනෑ. ඒක පොඩි උදාහරණයකින් කියන්නම්. ඒක ඇත්ත සිද්ධියකටත් සම්බන්ධයි. අපේ රටේ යම්කිසි හේතුවක් නිසා නිතරම කරදර කරන මීයෙක් මැරුව කියල හිතමු. එතකොට ස්වාමීන්වහන්ස අපි හිතනවා 'හොඳ වැඩේ ඔය මට කරපු එකට මම දුන්න පාඩමක්' කියල. එහෙම නැත්නම් 'අනේ මේ වගේ කර්ම නම් ආයේ සිද්ධ කරන්න වෙන්න එපා මට බේරෙන්න බැරි නිසයි මෙහෙම කරේ' කියල ඒ ගැන අනුකම්පාවෙන් හිතනවා. එහෙම නැත්නම් ඒ දෙකම නැතුව ඒක ඉවරයි කියල අමතක කරනවා. ස්වාමීන්වහන්ස ඔය අවස්ථා තුනේදී කර්ම මේරීම වෙනස්ද? පොඩ්ඩක් ඒ මෝරන ආකාරය පැහැදිලි කරලා දෙනවනම් බොහොම පිං.

<u>පිළිතුර</u> - එතැනදී ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන්නේ කර්ම හැදීමක්. දැන් ඉස්සරවෙලා කරේ සතා මැරුව. කර්ම හැදුන. එතකොට ඒ කර්ම හැදුනට පස්සේ ඒක ඒකේ ප්‍රමාණයට මෝරනවා. හැබැයි පසුව අපි හිතමු තව කර්ම දෙකක් ගැට ගැහෙනවා. එකක් තමයි හොඳ දේ කියල ඒ පාපය පිළිබඳව මිත්‍යා වශයෙන් ගිහිල්ල ඒක හොඳයි කියල right එකක් දෙනවා. එතකොට අපි සාමාන්‍ය කථාබහේදී කියනවා පවු අනුමෝදන් කරනවා කියල ඔය විදියට. එතකොට දැන් එතනදිත් සිද්ධ උනේ මොකක්ද පරණ කරපු කර්මය අරමුණු කරගෙන ඒකට හිතෙන් ප්‍රතිචාර දැක්වීම වශයෙන් තව කර්මයක් ඊට පස්සේ නැවත repeat උනා. දැන් හිතමු අනිත් පැත්තට කරායින් පස්සේ 'නෑ - මේ සතාට නැවත මේ වගේ සිද්ධ වෙන්ට එපා අනිත් එක මටත් මේ වගේ දෙයක් සිද්ධ කරන්න වෙන්න එපා' කියල නැවත ඊට පස්සේ අධිෂ්ඨාන කිරීම් වශයෙන් එතනදී කරන්නෙත් මොකක්ද විපාකයක් විඳීම නෙමෙයි නැවත පරණ කර්මය අරමුණු කරගෙන කර්මයක් හදනවා. පරණ කර්මය කළේ අකුසල. ඊට පස්සේ දැන් පරණ කර්මය අරමුණු කරගෙන එකක් අකුසල් හැදෙනවා අනිත් එක කුසල් හැදෙනවා. ඒක නිසා ඒකෙදි මෙන්න මෙහෙමයි ඕක හේතු ප්‍රත්‍යය ධර්මයන්ට අනුකූලව ගලපලා කියල තියෙන්නේ - ඉස්සරවෙලා කළේ කර්මයක්නේ - ඒ කර්මය මුල් කරගෙන (දැන් පරණ එක අකුසල කර්මයක් නේ)

**'පුරිමා පුරිමා අකුසලා ධම්මා'** - 'කල් ඇතුව පහළ උනාවූ අකුසල ධර්මයෝ'

**'පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං'** - අර අනුමෝදන් උනානේ - ඒ අකුසල ධර්මයට ඒක ප්‍රත්‍යය වීමක් උනේ -

එකක් **'හේතු ප්‍රත්‍යය'** වෙනවා අනිත් එක තමයි විශේෂයෙන්ම **'ආරම්මණ ප්‍රත්‍යය'** වෙනවා. අරමුණු කරානේ

**'පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං'** - හේතු පච්චයෙන් වෙනවා ආරම්මණ පච්චයෙන් වෙනවා ආදී ප්‍රත්‍යය ගණනාවක්ම තියෙනවා - එකින් එකට සම්බන්ධ වෙනවා. ඕක සිද්ධ වෙනවා. හැබැයි ඔය ප්‍රශ්නේ තියෙනවා මෙහෙම එකක්. ඕක මේරීමට එනවා - ඉස්සෙල්ල එක කල් ඇතුව මෝරනවා පස්සේ එක ඊට පස්සේ ඒකෙ හැටියට මෝරනවා. දැන් මේ කර්ම delete කරන්න බෑ. නැති කරන්න බෑ. හැබැයි යම්කිසි දේකින් - කර්මයකින් යම්කිසි පාඩමක් ඉගෙන ගත්තයින් පස්සේ ඒ කර්මය හැදිලා ඒක තිබුනාට ඒක විපාක දෙන්න එනකොට වෙන කර්මයකින් වහල දැමීමක් - block කිරීමක් විතරක් කරනවා. අකුසල කර්මයක් කරහම කුසල කර්මයක් කරලා ශක්ති සම්පන්න වෙනකොට විපාක දෙන්ට එන එක (විපාක දෙන්න එන්නේ මෝරපු හින්දනේ) හැබැයි විපාක දෙන්න එනකොට ඊට වඩා හයිය තියෙන කර්මයකින් වලක්වාගෙන වැට බැඳගෙන ඉන්නවා. ඒක තමයි ඔය සිද්ධ වෙන්නේ - මේරීම් සවභාවය කොහොමත් සිද්ධ වෙනවා. අපි හැම එක්කෙනාම කරන්නේ වලක්වාගෙන ඉන්න එකනේ - අපි භික්ෂූන් වහන්සේලා හැටියට - ඔය පහුගිය කාලේ 80 ගනන් වල රටේ කලබල කාරී ස්වභාවයක් තිබුනනේ. එතකොට ඒ කාලේ ගොඩක් අය මහණ වෙන්න ආව. මහණ වෙන්න ආවේ ගිහිව

ඉන්නකොට විපාක දෙන්න එන කර්ම තියෙනවා රටේ කලබලත් එක්ක -දැන් ඒ ගොල්ලෝ හොඳටම දන්නවා ඒවා මග හරවා ගන්න පුළුවන් මහණ උනහම කියල. ඒකනිසා සමහර අය ඇවිල්ල මහණ උනා. මහණ වෙලා හිටිය හේතුව නිවන් දකින්ට නෙමෙයි අර කර්මය වළක්වාගන්ට. දැන් කර්ම කථාව එච්චර ගැඹුරට ගියේ නැතත් කරදරේ වළක්වා ගන්ටනේ හිටියේ. ඔන්න ඔය වගේ දෙයක් කරනවා අපි හැම එක්කෙනාම - වළක්වාගෙන ඉන්නවා. හැබැයි ඒවා අපිට දන්නේ නැතුව මේරීම් ස්වභාවයට යනවා. ඒ අවස්ථාව ආපු ගමන්ම විපාක දෙන්න පුළුවන්. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි සවාමීන්වහන්ස බොහොම පිං - ඒවගේම ස්වාමීන්වහන්ස අපි කුසල කර්මයක් කරනවා - අපි හිතනවා බුදු කුටියක් හදල පූජා කරනවා එහෙම නැත්නම් බෝධි සරයක් එහෙම නැත්නම් අවාස ගෙයක් පූජා කරනවා කියල. එතකොට ස්වාමීන්වහන්සේලා හරි ගිහි පින්වතුන් හරි නිරන්තරයෙන් ඒකෙන් ප්‍රයෝජන ගන්නවා. පිං ලබා ගන්නවා එතකොට ඒවගේ එකක් මේරීමට බල පානවද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - වෙනවා - ඒ කියන්නේ අර පරණ කරපු කර්මය එනවා - ඒක හැබෑව. තවත් එකක් තියෙනවා මෙන්න මෙහෙම. ඔය මෝරනවා කියල කියන්නේ ඒ කරපු කර්මයට පස්සේ අලුත් අලුත් කර්ම කරනකොට අලුතෙන් අලුතෙන් කර්ම හැදෙනවා - ඒ කර්ම වල තිබෙනවා එකක් - ඔය චිත්ත වීථියක් යන කොට ඒ චිත්ත වීථියේ කර්මය සකස් වීම ආකාර කීපයකටයි සිද්ධ වෙන්නේ. දැන් අපි කර්මයක් කරන කොට - මේ ලෝකයට හේතු වෙන - මේ ලෝකයට විපාක දෙවන්ට ගැලපී යන ටිකක් ඒකෙ හැදෙනවා. ඒක ප්‍රතිසන්ධි වැඩේ කරන්නේ නෑ. ඒ තමයි අපි කථා කරන දිට්ඨ ධම්ම වේදනීය ස්වභාවය. ආන්න ඒකට ගැලපෙන ටිකක් එතනදී විපාක දෙනවා. ඒ විපාක දීම ඒ කර්මයේ අවස්ථාවක්. ඒකට ඉතින් පස්සේ කරන එක ඒ කර්මයට විපාක දෙන්ට අවස්ථාවක් වෙනවා. එහෙම දේවල් තියෙනවා.

බොහොම පිං ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ගෞරවණීය ස්වාමීන්වහන්ස එකක් තමයි අර ස්වාමීන්වහන්ස කිව්වනේ සමහර විපාක සිත් වලින් රූප පහළ වෙනවා නමුත් හැම එකකම රූප පහළ වෙන්නේ නෑ කියල. එතන තේරුනේ නෑ ඒවගේම ස්වාමීන් වහන්ස අර ඔබ වහන්සේ කියපු පාලි වාක්‍යයේ සිංහල තේරුම් කියල දෙනකොට **'විපාකා චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං විපාකපච්චයෙන පච්චයො'** කියන වාක්‍ය සිංහලෙන් වචන ටිකේ තේරුම ... තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - හොඳයි - හැබැයි මම ඒක කිව්වේ නෑ. මම කියපු වාක්‍යයක් නෙවෙයි ඕක. මම ඒක කියන්නේ නැතුව වෙන එකක් කිව්වේ.

එකක් තමයි - කලින් එකට උත්තරේ සපයා ගමු. සමහර සිත්වලින් විතරයි රූප උපදවන්නේ. සමහර විපාක සිත්වලින් රූප උපදවන්නේ නෑ. දැන් ඔය චක්ඛු විඤ්ඤාණ සිත් වලින් අමුතුවෙන් එහෙම රූප උපදවන්නේ නෑ. අනිත් එක තමයි අරූපාවචර බ්‍රහ්මලෝකේ විපාක

සිත් පහළ වෙනවනේ. දැන් ඒ අරූපාවචර විපාක සිත්වලින් රූප උපදවන්නේ නෑ. එතැනදී කරන්නේ විපාක සිත් වලින් -මෙහෙදී කයකට සම්බන්ධව - අපි හිතමු මනුස්සයෙක් හරි - යෝගියෙක් හරි - ස්වාමීන්වන්සේ නමක් හරි භාවනා කරන්නාවූ කෙනෙක් හරි - එයාට තියෙනවනේ ඇඟක් - ශරීරයක් තියෙනවනේ - එතකොට මරණාන්තය දක්වාම ඒ ශරීරය ආධාර කරගෙන හිත් පහළ වෙනවා - චෛතසික පහළ වෙනවා - එතකොට කර්මජ රූපත් පහළ වෙනවා - ප්‍රවෘති වශයෙන් චිත්තජ රූපත් පහළ වෙනවා. ඍතුජ ආහාරජ ප්‍රශ්නයක් නෑනේ. දැන් මේ ටික ඔක්කෝම නාම ධර්ම ආශ්‍රය කරගෙන පහළ වෙනවා. ඉතින් මෙයා භාවනා කරලා අරූපාවචර ධ්‍යාන වඩනවා. අරූපාවචර ධ්‍යාන කියල කියන්නේ විපාක සිත් නෙමෙයි මෙහෙ කුසල සිත්. රහත් නොවී ඉන්න හින්ද අරූපාවචර ක්‍රියා සිත් පහළ වෙන්නෙත් නෑ. මේ ඔක්කෝම පහළ වෙන්නේ කුසල සිත්. දැන් අරූපාවචර ධ්‍යාන සමාපත්තියට සමවැදිලා ඉන්නවා - ගොඩක් කුසල් සිත් පහළ වෙන්නේ. පැය ගණන් ඉන්නව - කුසල් සිත් පහළ වෙන්නේ. කොහොම හරි මෙයා චුතවෙනවා. දැන් මෙයා මනුස්සලෝකේ රූපයක් එක්ක තමයි රූපාවචර ධ්‍යාන වැඩේ කරේ. හැබැයි එයා මනුස්සලෝකෙන් චුතවෙලා අරූපාවචර බ්‍රහ්මලෝකේ උපදිනවා. අරූපාවචර බ්‍රහ්මලෝකේ උපදින කොට එහෙදි එයාට ප්‍රතිසන්ධි සිත පහළ වෙනවා. ප්‍රතිසන්ධි සිත පහළ උනාට ප්‍රතිසන්ධි රූප පහළ වෙන්නේ නෑ.

මනුස්ස ලෝකේ උපදිනකොට ප්‍රතිසන්ධි සිත පහළ වෙනවා - ප්‍රතිසන්ධි කර්මජ රූප පහළ වෙනවා - ප්‍රතිසන්ධි විපාක රූප පහළ වෙනවා. එතකොට අරූපාවචර බ්‍රහ්මලෝකයේ ප්‍රතිසන්ධි සිත පහළ වෙනවා චෛතසික පහළ වෙනවා හැබැයි රූප නෑ. හේතුව ඒ විපාක සිත්වලින් රූප උපදවන්න බෑ කියන එකයි. එතකොට චක්ඛු විඤ්ඤාණ සිත් වලිනුත් රූප උපදවන්න බෑ. සමහර ඒවගෙන් විතරයි උපදවන්න පුළුවන් කම තියෙන්නේ. දැන් භවාංග සිත තිබෙනවානේ - ඒකෙන් දිගට දෙනවා රූප. දැන් ඒකෙ තියෙන්නේ - භවාංග සිත ඇවිල්ල විපාකයක් - ඉතින් ඒකෙ හොඳට හැදෙනවා චිත්තජ රූප. භවාංග සිත හයිය එකක් නෙමෙයිනේ - සමාන්තරව හරියට ගඟක් සැර නැතුව නිකම්ම ඇහැට පෙන්නේ නැතුව ගලාගෙන යන විදියක් තියෙන්නේ - ගඟ ගලනවා කියල පෙන්නේ නෑ වතුර තියෙනවා වගේ තමයි පේන්නේ. ඒවගේ ගලාගෙන යන තියෙනවනේ ගංඟා. භවාංග සිත ඒවගේ ගලාගෙන යන ප්‍රවාහයක් - ඒකෙ රූප උපදවන ශක්තිය තියෙනවා. ඒ හිතේ හැටියටම තමයි රූප හැදෙන්නේ. ඒකනේ ඔය මිනුස්සු පණ නැතුව කිරාවැටෙන කොට හයිය නැතුව ඉන්න කොට 'මොකද නිදි මතද' 'මොකද නින්ද ගියාද' 'නිදි කරනවද' කියල අහනවා 'මොකක්ද ඔය හයියක් නෑ නිදි මතේද' කියල ඔහොම කියනවනේ. ඒ කියන්නේ ඒ නින්ද කියල කියන්නේ භවාංග සිත් පේළිය - ඒකෙ තියෙන හැඩේ ගහනවා රූප වලට. ඉතින් ඒක සිද්ධ වෙනවා. හැබැයි අරූපාවචර එකේ එහෙම නෑ.

අනිත් කථාව තමයි ඔය අව්‍යාකෘත ධර්ම පිළිබඳව කියපු කථාව විතරයි මම ප්‍රකාශ කළේ. තව එකක් තිබෙනවා ඒක සකන්ධ හැටියට තමයි කියන්නේ.

තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ගෞරවණීය සවාමීන්වහන්ස පාද නමස්කාර කරනවා ඔබ වහන්සේගේ - මට පොඩ්ඩක් දැනගන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස උපේක්ෂා සහගත සන්තීරණ සිත (අකුසල විපාක) උපේක්ෂා සහගත සන්තීරණ සිත (කුසල විපාක) සතර අපාය දුගතියේ උප්පත්තිය ලබන්න හේතු වෙන නිසා ඒ ගැන පොඩ්ඩක් වටහාල දෙන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඒවගෙන් තමයි සතර අපායේ උපදින්නේ. ඒක ඇවිල්ල විපාක සිතක්. ඒකට බලය ගන්නන්නා වූ සිත් තියෙනවා 12 ක්. බලය ගන්වන සිත් 12 ක් තියෙනවා. ඒ 12 තමයි අකුසල් සිත් 12. (ලෝභ මූල සිත් 8 + ද්වේශ මූල සිත් 2 + මෝහ මූල සිත් 2) ඉතින් ලෝභ කරලා - ලෝභ කරලා - ලෝභ කරලා ගොඩක් අකුසල් වැඩුනහම - ද්වේශය හදල හදල හදල ද්වේශය වැඩිලා වැඩිලා වැඩිලා අකුසල් හැදුනම - මෝහයත් වැඩුනම මේ ස්ථාන 12 න් හැදෙන ශක්තිය හැදිලා හැදිලා හැදිලා තියෙනවා. දැන් මේ හිත් 12 න් හැදිච්ච - එකතු වෙච්ච -ගොනු වෙච්ච අකුසල ශක්ති තියෙනවා කර්ම හැටියට එකතුවෙලා චිත්ත පරම්පරාවට යම්කිසි ආකාරයකට සම්බන්ධයක් ඇතුව තියෙනවා. එතකොට දැන් මේකට පරිසරයක් ඕන. පරිසරයක් ඕනෑ විපාක දෙවන්ට. මෙහෙම පිටි පස්සේ අකුසල් ගොඩක් කරලා කරලා කරලා වැඩි උනහම - මෙහෙන් මනුස්සයෙක් චුතවෙන අවස්ථාවේදී එයාට ඊළඟ ජීවිතයේ ඒ අකුසල් වල තිබෙන සැර ටික පිට කරන්න පුළුවන් වෙන විදියේ පරිසරයක් ඕනෑ එයාට ඇඟක් හිතක් හැදෙන්න. ආන්න ඒ අවස්ථාවකදී ඔය අකුසල් විපාක සන්තීරණ හිත ඉදිරිපත්වෙනවා ප්‍රතිසන්ධි හිතක් හැටියට. ඒ ඉදිරිපත් උනාම කර්මයේ බලය හැටියට ලෝභ මූල වැඩිනම් ද්වේශ මූල වැඩි නම් මෝහ මූල වැඩිනම් ඒකෙ හැටියට තිරිසන් ලෝකයේ හරි ඊළඟට ප්‍රේත ලෝකයේ හරි සතර අපායේ හරි ප්‍රති සන්ධිය ගන්නලා දෙනවා ඔය උපේක්ෂා සහගත අකුසල විපාක සන්තීරණය. ඊළඟට සමහර තැන් වලදී කුසල විපාක සන්තීරණයෙන් වෛමානික ස්ථාන වල ඒවාගේම බොහොම දුර්වල තැන්වල ඉපදෙනවා. එකක් තමයි - ඔය උපේක්ෂා සහගත හිත් දෙක (කුසල් සහ අකුසල්) ඒ දෙක යම්කිසි තැනක ගැට ගහල දෙන්න විතරයි උදව් වෙන්නේ. හැබැයි කුසල විපාක සන්තීරණයට අකුසල් ඉදිරිපත් වෙන්නේ නෑ. ඔය නිකං අඩු පාඩු ඇතුව කරන පිං තියෙනවනේ. ඔය නිකං වටපිට බල බලා හිතත් යොදන්නේ නැතුව දෙන්නම් වාලේ කරන ඒවා තියෙනවනේ. ආන්න ඒ වගේ හයිය නැති - අඩු ශක්ති තියෙන ඔය පිං වල තිබෙන දේවල් ඒ අඩු විදියටම විපාක දෙවන්ට ඉදිරිපත් වෙන ප්‍රතිසන්ධි ස්ථානය තමයි ඔය උපේක්ෂා සහගත සන්තීරණ කුසලයෙන් පහළ වෙන්නේ. ඊට පස්සේ ඒකෙන් ගියහම අනිත් විපාක සිත් දිගටම ඉදිරිපත් වෙනවා. ඒක නිසා මේක කර්ම හිතක් නෙමෙයි. මේක විපාක හිතක්. මේ දෙක start කරලා දෙනවා උපදින්ට. හැබැයි ඔය සන්තීරණ සිත කියන එක උප්පතිය විතරක් ලබා දෙන්නේ නෑ. උප්පත්තියටත් හේතු වෙනවා. හැබැයි චිත්ත වීථියක චක්ඛු විඤ්ඤාණයෙන් පස්සේ සම්පටිච්ඡන සන්තීරණ අවස්ථාවේදීත් ඒ අරමුණට අනුවත් වැඩ කරනවා. ඊළඟට තව එකක් - චිත්ත වීථියක කෙලවරේ අර තදාරම්මණ හැටියටත් ඕක වැඩ කරනවා. ඒකනිසා

එක වෙලාවක ප්‍රතිසන්ධිය ඊට පස්සේ ඒ ජීවිතයේ භවාංග හැටියට සන්තීරණය වැඩ කරනවා. ඊළඟට චිත්ත වීථියක සන්තීරණ කෘත්‍ය සිද්ධ කරන්න ඉදිරිපත් වෙනවා. ඊළඟට ඔය තදාරම්මණ හැටියට ඉදිරිපත් වෙනවා. ඒකනිසා ඕය සිත්වල වැඩ කෑලි කීපයක් තිබෙනවා. ඒකෙ එක වැඩක් තමයි ඔය ප්‍රතිසන්ධිය ගැට ගැහීම. තෙරුවන් සරණයි!

බොහෝම පිං තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මේ විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා හැදෙන ප්‍රත්‍යය උප්පන්න රූප කොටස් දැන ගත්තහම ප්‍රතිසන්ධි කර්මජ රූපය කියන එකනම් තේරුම් ගන්න පහසුයි මොකද ප්‍රතිසන්ධි සිතත් එක්කම ඒක සහජාතව ඒ විදියටම ප්‍රතිසන්ධි කර්මජ රූප ප්‍රත්‍යය උප්පන්න භාවය ලබනවා කියල විපාක සිත නිසා. එතකොට ස්වාමීන්වහන්ස මේ ප්‍රවෘති කර්මජරූප ගැනයි ප්‍රශ්නය ආවේ. ඒකට හේතුව උනේ විශේෂයෙන්ම අපි කිව්වොත් එහෙම සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට එනකොට සිත් ඇතිවෙන්නේ නැතිනිසා කර්මජ රූපවල ප්‍රවෘතියට කෙලින්ම සිතේ බලපෑමක් තියෙනවද කියන ප්‍රශ්නය තමයි මුලින්ම ආවේ ස්වාමීන්වහන්ස. ඒ ගැන අපිට පොඩ්ඩක් විස්තරයක් ලබා දෙන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - අවශ්‍ය නෑ. ප්‍රවෘති කර්මජ රූප - සිත් ඇතුවත් වෙනවා නැතුවත් වෙනවා. දැන් රහතන්වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවැදුනම හිත නිවිලානේ තියෙන්නේ. හිත ක්‍රියාත්මක නෑ - චෛතසික ක්‍රියාත්මක නෑ - නමුත් කෙලින්ම ඒක රහතන්වහන්සේ හිත නැවත්තුවයි කියල නිවනට පත් උනහම නිරෝධ සමාපත්තියේදී ඒ අධිෂ්ඨාන කරපු වෙලාව ඇවිල්ල බලන කොට තියෙන්න එපාය ඇහැක් - තිබෙන්න එපාය - අතක් පයක් තියෙන්න එපාය - කවුරුහරි කෙනෙක් කථා කරන කොට අහන්න කනක් එහෙම ඔක්කොම තියෙන්න එපාය. ඒකනිසා හිත තියෙන වෙලාවේදීත් කර්මජ රූප පහළ වෙනවා - හිත නැතුව උනත් කර්මජ රූප පහළ වෙනවා. ඒ විශේෂ අවස්ථාවලදී කර්මජ රූප දිගට ගලාගෙන යනවා. ඒක නිසා හිත කෙලින්ම අවශ්‍යතාවයක් නෑ. අනිත් එක තමයි ඕක සරලව හිතුවොත් එහෙම දැන් රූපාවචර අසංඥ තලයේ දිගටම කර්මජ රූප හටගන්නවා - කර්මජ රූප පරම්පරාව දිගටම පවතිනවා. කිසිම හිතක් සම්බන්ධ නෑ. ඉතින් කර්මජ රූප ඍතුජ රූප විතරයිනේ ඕකේ තියෙන්නේ - චිත්තජ රූප නැනේ. ඒක නිසා ඒක අවශ්‍ය නෑ.

ස්වාමීන්වහන්ස එතකොට මේකෙදී ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට ඇත්තටම අපිට ප්‍රතිසන්ධි කර්මජ රූපය සලකනවා අනිවාර්යයෙන්ම - එතකොට ප්‍රවෘති කර්මජ රූප කියන එක ඇත්තටම සඳහන් කලයුතුත් නෑ කියල හිතෙනවා ස්වාමීන්වහන්ස විපාක ප්‍රත්‍යයෙන් - එහෙම ගත්තොත් නිවැරදිද?.

<u>ස්වාමීන්වහන්සේ</u> - විපාක ප්‍රත්‍යයයේදී අන්නෝන්‍ය වශයෙන් ගන්නේ චිත්ත චෛතසික ධර්මී විතරයි. චිත්ත චෛතසික රූප එක්කාසු කරන්නේ නෑ. හේතුව චිත්ත චෛතසික රූප එක්කාසු කරන්නේ නැත්තේ හිතෙන් සහ චෛතසික ධර්මීයන්ගෙන් ප්‍රත්‍යය ලබාගෙන කර්මජ රූපත් පහළ වෙනවා - චිත්තජ රූපත් පහළ වෙනවා. ඒක හරි - කර්මජ රූප ප්‍රවෘති වශයෙන් පහළ වෙනවා - හැබැයි ඒ දෙගොල්ලෝ එක්කාසු කරන්නේ නැත්තේ - කර්මජ රූප නිසාවෙන් එක අවස්ථාවක් ඇරෙන්න කර්මජ රූප නිසාවෙන් සහ චිත්තජ රූප නිසාවෙන් චිත්ත චෛතසික පහළ වෙන්නේ නෑ. ඒක නිසා නාම ධර්මීයන්ගේ බලපෑම නිසා - හයිය ශක්තිය නිසා රූප ධර්මී හැදෙන එක එකක්. හැබැයි මෙතැන තිබෙන රූප ධර්මීවල හයියක් නිසා නාම ධර්මී හටගන්නේ නැතිනිසා එතනදී එකතු කරන්නේ නෑ. චිත්ත චෛතසික ධර්මී විතරයි එකතු කරන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපිට හුගක් වෙලාවට ඇහෙන දේවල් තමයි විපාක වශයෙන් භවබෝග ලැබෙනවා ඒ කියන්නේ කෙනෙකුට ලොතරැයියක් ඇදුනොත් එහෙම එයා පෙර කරපු පිනකට තමයි ඒක සිද්ධ උනේ කියල. ඒ වගේ දැන් කෙනෙකුට රූප සම්පත්තිය ගත්තත් අපි හිතනවා එයා පෙර කළ පින අනුව තමයි එහෙම උනේ කියල. එතකොට අපි නිතරම භෞතිකව තිබෙන රූප ආශ්‍රයෙන් එහෙම නැත්නම් ලැබෙන ලාභ ආශ්‍රයෙන් ඒ කියන්නේ රහට කෑම වේලක් ලැබුනත් අපි කියනවා කුසල විපාක නිසා කියල. ඉතින් අපි දන්නවා ජිව්හා විඤ්ඤාණය නම් පෙර විපාකයක් හින්ද කියල. එතනින් එහාට කොහොමද ස්වාමීන්වහන්ස ඒක අපි තේරුම් ගන්නේ. උදාහරණයකට රූප සම්පත්තිය වගේ දේවල්.

<u>පිළිතුර</u> - ඒවගෙත් තියෙනවා මහත්තය ඒ කාරණේ. ඒවගෙත් direct විපාක එනවා indirect විපාක එනවා. දැන් ඔය උපධි සම්පත්තිය කියන එකත් කර්ම විපාකයක්. ඊට පස්සේ අපිට ලස්සන රූප මුණ ගැහෙනවා කියල කියන්නෙත් කර්ම විපාකයක්. කන්න බොන්න හම්බවෙනවා කියල කියන්නෙත් කර්ම විපාකයක්. කර්ම විපාක තියෙනවා ආකාර කීපයක් - ඒවා කෙලින්මත් එනවා - ආරම්මණ වශයෙන් එනවා - ඒවාගේම අපිට හිතල සැනසෙන්ට පුළුවන් ඒවා වශයෙන් එනවා. අනිත් එක තමයි කර්මයෙන් තව දේවල් හදල ලං කරලා දෙනවා - ඇත්තවශයෙන්ම අපි හිතමු මෙහෙම - දැන් මහත්තයාට කර්ම ටිකක් තියෙනවා - ඒකෙන් මහත්තයා කරලා තියෙන කර්ම තමයි හොඳ ලස්සන රූප ටිකක් හදල ඒවා පෙන්නන චක්ඛු විඤ්ඤාණ පහළ කරන සතුටු කරන කර්ම. ඒ චක්ඛු විඤ්ඤාණ දැන් විපාක වශයන් එන්න තියෙනවා. හැබැයි මහත්තය ඉන්නේ ඒවගේ කිසිම රූපයක් නැති පරිසරයක කියමුකෝ. එතකොට එහෙම ලස්සන රූපයක් වටපිටාවේ ගස් කොළංවලවත් ගන්ට නෑ - ඔක්කොම තියෙන්නේ තණකොළ වගේ ඒවා ටිකක් පිරිලා තියෙන්නේ - ඉතිං එතැන මහත්තයට කර්ම තිබුනට විපාක දෙන්ට චක්ඛු විඤ්ඤාණ හදන්ට - විපාක සිත් හදන්ට කර්ම තිබුනට ඒ චක්ඛු විඤ්ඤාණ පහළ වෙන්ට තණකොළ වලින් ගල්ගෙඩි වලින් බෑ. ඒක නිසා කර්මයේ තිබෙනවා තව ගතියක් කර්මය හේතු කරගත්තාවූ ඍතුජ රූප හදල දෙනවා. ඒක කරන්නේ කර්මයෙන්මයි. ඒක තමන් ලඟ නෑ. හිතින් හදන්නේ - දැන් කිසිම විදියක කර්ම සම්බන්ධයක් මේ ඇහෙන් එහාට ඇත්තෙත් නෑ හැබැයි නැත්තෙත් නෑ. වෙන තැනක

ලස්සන මල් ටිකක් හදල මාළිගාවක් හදල ගෙවල් දොරවල් ටිකක් හදල - ඒවා ඉස්සෙල්ල නෑ - ඉතින් මේවා හදල ඒවා දර්ශනය කරලා දෙනවා මහත්තයාගේ ඇහැට කනට නාසයට දිවට. ඊට පස්සේ ඒකෙන් තමයි මහත්තය අර විපාක සිත් ටික ගන්නේ. දිව්‍ය ලෝකේ වෙන්නෙත් ඕක. සමහර තැන්වල මනුස්ස ලෝකේ වෙන්නෙත් ඔය ටිකමයි.

බොහොම පිං ස්වාමීන්වහන්ස මට හිතුනේ දැන් අපිට ආහාරයක් ලැබෙනව කියන තැනත් ඇස කන පිනවන ඒ ගැන සතුටු වෙන අවස්ථාව ගත්තොත් එතැනදී විපාක වශයන් චක්ඛු විඤ්ඤාණ ජිව්හා විඤ්ඤාණ කුසල විපාක වශයෙන් පහළ වෙනවා වගේම දැන් ආහාරය කියන කොට ඍතුජ රූපයක් හැටියටත් කර්මය හේතුවෙන් අපිට හම්බවෙනවා කියල හිතුවොත් ඒක නිවැරදිද ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - කර්මය උපස්තම්බනය වූ - කර්මයෙන් එළවා දෙන්නාවූ ඍතුජ රූපයක් තියෙන්නේ. අපි ගන්නේ කර්මජ රූපයක් නෙමෙයි. අපි ගන්නේ ඍතුජ රූපයක් තමයි. හැබැයි ඒ ඍතුජ රූපය හදල ඉස්සරහට දාල දෙන්නේ කර්මයෙන්.

කර්ම සමුට්ඨාන ඍතුජ රූප?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් කර්ම සමුට්ඨාන ඍතුජ රූපයක් හම්බ වෙන්නේ.

හොඳයි ස්වාමීන්වහන්ස බොහොම පිං

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස දැන් ලෝණඵල සූත්‍රයෙදී වගේ කර්මය ලුණු කැටයක් ගඟකට දානවා වගේ කර්මය පහ වෙනවා වගේ - සතිපට්ඨානයේ වෙන්නෙත් ඒකමද ස්වාමීන්වහන්ස? දැන් මේ මොහෙතේ හිත පවත්වාගෙන ඉන්න පුළුවන් නම් යම්කිසි කෙනෙකුට තමන්ගේ කර්මය ඈත්කර ගන්න පුළුවන් විදියක් නේද ස්වාමීන්වහන්ස එතැනදී තේරුම් කරගන්න පුළුවන්?

<u>පිළිතුර</u> - මෙහෙමයි - සතිපට්ඨානෙත් කර්ම හැදෙනවා. ඇත්තට මෙන්න මෙහෙම එකක් තියෙනවා. අභිධර්මය දිහා බලල කර්මය ගැන කථා කරන කොට හය හිතෙනවා. ඇත්තටම හය හිතෙනවා. ලෝණ ඵල සූත්‍රය දිහා බැලුවයින් පස්සේ ඩිංගක් හය නැතිවෙනවා. ඒ කියන්නේ ලෝණ ඵල සූත්‍රයේ තිබෙන්නේ කර්ම නැති කිරීම නෙමෙයි ඒකෙ අඩු කිරීමක්. එක කර්ම ගොඩක් වැඩි උනහම - කුසල කර්ම ගොඩ වැඩි කරයින් පස්සේ ඒ කුසල කර්ම වැඩි වෙන්ට වැඩි වෙන්ට අකුසල කර්ම වලට අවස්ථාව නැතිවෙන එකයි කියන්නේ. හැබැයි ඒකෙන් කියන්නේ නෑ සම්පූර්ණ අර ටික නැති උනයි කියල. කුසල කර්මය විපාක දීල දීල දීල නිවනට යන්නේ නැතුව හිටියොත් එහෙම ඒ මනුස්සයාව කුසල් කර්ම ටික දිව්‍ය ලෝකයෙහි මනුස්ස ලෝකයේත් විපාක දීල දීල ඒකත් ටිකක් ගෙවිලා යනවනේ - ඕක සදාකාලික නැනේ - ඕක ගෙවිලා ගිහිල්ල දැන් කුසල rate එක බහිනවා. කුසල කර්ම 100 කරගත්ත. ඒ කුසල කර්ම 100 ට අකුසල කර්ම තියෙනවා 15 ක් විතර - හරි හයිය තියෙන අකුසල කර්ම - කුසල කර්ම 100 කරපු හින්ද මේ අකුසල කර්ම 15 ට හැප්පෙන්න බෑ මේ 100 ත් එක්ක. හැබැයි ඉතින් පසු බහිනවා. පසු බැහැල අර කුසල කර්ම 100 දිව්‍ය ලෝකේ

මනුස්ස ලෝකේ සැප දිදී දිදී ඔහොම දිගට ගෙනියනවා. මෙහෙම දිගට ගෙනියන කොට මේක විපාක දීල දීල ගෙවිලා ගෙවිලා යනවා. උදැල්ලකින් වැඩ කරනකොට - දිගටම මාස ගානක් අවුරුදු ගානක් වැඩ කරන කොට ඒ උදලුමිටත් ගෙවිලා යනවා උදලු තලෙත් ගෙවිලා යනවා. යම්කිසි වාහනයක් නිතර නිතර දුවන කොට ඒ වාහනේ ඇණ කැල්ලක් ගානේ ගෙවිලා යනවා - ටයර් එකත් ගෙවිලා යනවා - ඒ හැම එකක්ම ගෙවිලා යනවා. පස්සේ නිකං ලඩලමක් බවට පත්වෙනවා. ඒ වගේ මේ කුසල කර්ම විපාක දීල දීල දීල අවසානයේදී මේකේ සම්පූර්ණ කුසල කර්ම rim එකෙන් යනගානට පත්වෙනවා. එහෙම යනකොට අර දූර්වල වෙලා හිටපු 15 දෙනා ඉන්නවනේ එන්න බැරුව - ඒගොල්ලෝ ඔලුව උස්සනවා - ඒ අකුසල කර්ම 15 වෙන් දිට්ඨධම්ම වේදනීය කර්මයි උප්පජ්ජවේදනීය කර්මයි නැතිවෙන්න පුළුවන්. හැබැයි අපරාපරිය වශයෙන් store වෙලා තිබෙන්නාවූ කොටස් 5 හ time එක එනකම් බලාගෙන ඉන්නවා. ඒක විපාක දෙනවා. හැබැයි ලෝණඵල සූත්‍රයේ යම්කිසි සැනසිල්ලක් එනවා කුසල කර්ම වැඩි කරයින් පස්සේ අකුසලයට එන්න දෙන්නේ නෑ කියන එක. හැබැයි අභිධර්මයට අනුව බැලුවයින් පස්සේ ඒක භයානකයි. ඒකනිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ කුසල කර්ම වැඩි කරලා වැඩි කරලා හොඳටම වැඩි කරලා අර 15 දෙනා අපි හිතමු - උපකල්පනය කරමු අර 15 දෙනා එන්න බලාගෙන ඉන්නවයි කියල - ඒකනිසා ඒ 15 දෙනයි - තව කුසල් තියෙනව නම් ඔක්කොමයි නැති කරන්න ඕනේ රහත් මාර්ග හිතෙන්. එතනින් ගියැන් පස්සේ කරපු ඒවත් ඉවරයි කවුරුත් අල්ලගන්න බෑ. හිතකුත් නෑ චිත්ත පරම්පරවකුත් නෑ රූප පරම්පරාවකුත් නෑ මොකක්වත් නෑ. ඒකයි බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ.

අනිත් එක තමයි සතිපට්ඨාන සූත්‍රයේ කියන්නේ නෑ සතිපට්ඨාන සූත්‍රය වැඩුවයින් පස්සේ කුසල කර්ම සිද්ධ වෙන්නේ නෑ කියල. කුසල කර්ම සිද්ධ වෙනවා - කුසල කර්ම නැතිවීම සිද්ධවෙන්නේ සෝවාන් මාර්ග සිතෙන් විතරයි. ඒ වෙනතෙක්ම සතිපට්ඨානය තුල කුසල් අනාපානයෙනුත් වැඩෙනවා - ඊට පස්සේ දෙතිස් කුණුප වලිනුත් වැඩෙනවා - චිත්තානු පස්සනාවෙනුත් වැඩෙනවා - ඔය හැම එකෙන්ම - විපස්සනා භාවන කරන කොට නිවන් අවබෝධකරගන්ට හේතුවෙන බලසම්පන්න කාමාවචර කුසල් පහළ වෙනවා. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අප්‍රමාණ පිං. මම කිව්වේ ස්වාමීන්වහන්ස මම තේරුම් ගත්ත විදියට අකුසල කර්ම විපාක දෙන්න බෑ කියල දිගටම කරගෙන යනකොට. සමාවෙන්න ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක පුළුවන් - ආවත් ඉතින් ගන්න ගන්නේ නැනේ. දැන් සතිපට්ඨානය වඩාගෙන වඩාගෙන යනකොට හොඳයි නරකයි ඔක්කෝම සතිපට්ඨානයට දානවනේ. දාල ඉතින් කුසලය කුසල හැටියට ගන්නවා - අකුසලය අකුසල හැටියට ගන්නවා - හොඳ හොඳ හැටියට ගන්නවා - වේදනාව වේදනාව හැටියට ගන්නවා - සැප සැප හැටියට ගන්නවා - එන වේදනාව සැපයක් වෙනව කුසලයක් වෙනවා - එක වෙලාවකට අකුසලයක් වෙනවා - ඉතින් ඒක ඒ වෙලාවට ඉදිරිපත් වෙච්ච වේදනා ස්වරූපයෙන් - කර්ම කථාවක් එකතු

කරගන්නේ නැතුව ඉදිරිපත් වෙච්ච හැටියට දකිනවා මෙනෙහි කරනවා - එතකොට අකුසල් වැඩීම වෙන්නේ නෑ - හොඳයි

සාධූ සාධූ අප්‍රමාණ පිං.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වමීන්වහන්ස දැන් අංගුලිමාල ප්‍රාණඝාත කරාට ඒ භවයෙහිම රහත් භාවයට පත් උනානේ ස්වාමීන්වහන්ස. එතකොට කොහොමද එතෙන්දි ඒ උන්වහසේට ඒ තත්වයට පත්වෙන්න පුළුවන් උනේ. එතැන පොඩ්ඩක් අභිධර්මයත් එක්ක පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. ගොඩක් පිං.

<u>පිළිතුර</u> - යම්කිසි කෙනෙක් මේ ජීවිතයක කර්ම සිද්ධ කරන කොට කර්ම කොට්ඨාස තුන් ආකාරයකට බෙදී යනවා. ඒ විදියට තමයි සිත් වැඩ කරන්නේ. කවුරුවත් කරන එකක් නෙමෙයි. දැන් මේ ජීවිතයේදී කර්ම කළාම ඒකෙ කොටසක් මේ ජීවිතියේ විපාකයට බෙරී තේරී යනවා තව කොට්ඨාසයක් උප්පත්තිය ලබල දීම වශයෙන් ඊළඟ භවයට විපාක දීම සඳහා බේරී තේරී අයින් වෙනවා. අනිත් එක තුන්වෙනි ජීවිතයේ ඉඳල ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රවෘති වශයෙන් දිගටම විපාක දෙන්න යනවා. ඒක සීමාවක් නෑ. අංගුලිමාල මහා රහතන්වහන්සේ මීට ඉස්සෙල්ල ජීවිත වල කුසල් කරලා තියෙනවා. නමුත් අංගුලිමාල මහා රහතන්වහන්සේගෙන් මේ ජීවිතියේ උනේ ගොඩක් මනුෂ්‍ය ඝාතන කර්මය සිද්ධ උනා. එතකොට මනුස්ස ඝාතන කර්මය සිද්ධ උනාට රහත්භාවය ලබාගන්ට හේතුවෙන විසාල කුසල කර්ම බල ඇණියක් උන්වහන්සේගේ පිටිපස්සේ තිබුන. එතකොට ඒවගෙන් මෙහෙයවන ලදුව මාර්ගය - සත්පුරුෂ ආශ්‍රය - ධර්මය ඇසීම හේතුවෙලා - සිහිය නුවණ කියන කුසල ධර්ම - බොජ්ඣංග ධර්ම - ඊට පස්සේ මාර්ග අංග වැඩිලා උන්වහන්සේ සංසාරය කෙළවර කරා. එතකොට නැවත ප්‍රතිසන්ධි සිද්ධවෙන්න අවස්ථාවක් නෑ. එතකොට කෙලින්ම මේ ස්වාමීන්වහන්සේ සංසාරය නැවැත්වුවා. නැවත ඊලඟට ප්‍රතිසන්ධියක් හටගන්නේ නෑ. එතකොට මේ රහතන් වහන්සේට අර ඒ ජීවිතියේ කරපු කර්ම ටිකෙන් තීරණය උනාට තුන්කොටසකට - දෙන්න පුලුවන් කම තියෙන්නේ එක කොට්ඨාසයක් විතරයි. ඒ කියන්නේ උපපජ්ජනීය වශයෙන් ඊළඟ ජීවිතයේ ගැට ගහගන්න බෑ කර්මයක් - අපරාපරිය වශයෙන් ඉස්සරහට ගෙනියන්න බෑ කර්ම වලට. හේතුව ඒ ස්වාමීන්වහන්සේ උපත නැති කරපු නිසා. එතකොට දෙනවනම් දෙන ටිකක් ඔය කර්ම ගොඩෙන් අර දිට්ඨධම්ම වේදනීය වශයෙන් වෙන් වෙච්ච ටිකෙන් තමයි දෙන්න වෙන්නේ. ඒක නිසා ඒ ස්වාමීන්වහන්සේට ප්‍රතිසන්ධි ගොනුවෙන කර්ම ක්‍රියාත්මක වෙන්නේ නෑ. නමුත් උන්වහන්සේට දිට්ඨධම්ම වේදනීය වශයෙන් නම් කර්ම ආව. ඔය තැන් තැන් වල යන ගල්මුල් අරව මේවා වැදුන. නරක නාම - ඊට පස්සේ තුවාල වීම ආදී දේවල් උන්වහසේගේ ජීවිතේට ආව. ඒවා උන්වහසේත් දැනගත්ත බුදුරජාණන්වහන්සේත් දැන ගත්ත. හැබැයි ඒව ටිකත් ඉවරයි උන්වහන්සේ පිරිනිවන් පෑවට පස්සේ.

හොඳයි ස්වාමීන්වහන්ස බොහෝ පිං.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි දන්නවා දැන් කුසල කර්මයක් හෝ අකුසල කර්මයක් කරනවා කියන අවස්ථාවේදී චිත්ත වීථි පහළ වෙනවා කියල අපි ඉගෙන ගෙන තියෙනවා. ලක්ෂ

කෝටි ගානක් පහළ වෙනවා කියල. ඒත් එක්ක බලන කොට ස්වාමීන්වහන්ස එක බැටළුවෙක් මැරුවොත් ඒ කර්මයට ඒ බැටළුවාගේ ලොම් ගානට බෙලි කැපුම් කැව කියල ධර්මයේ සඳහන් වෙනවා. එතකොට අපිට ඒක හිතාගන්න වෙන්නේ ඒ කර්මය කරන අවස්ථාවේදීම ඇත්තටම ඒ පහළ වෙන සිත් ප්‍රමාණය අනුව ඒකෙන් නිපදවන කර්මයද මේ විටින් විට ඒ ලෝම ප්‍රමාණයටම බෙලි කැපුම් කන්න හේතු උනේ කියල ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඒකෙ තියෙන්නේ එළුවෙක් කියලා- එතකොට ඒ එළුවා මරපු විදිය ක්‍රියාව විතරයි කියල තියෙන්නේ. ඒකෙ චිත්ත වීථි ගාන නිර්ණය කරන්නේ නෑ. මදුරුවෙක් මරණ කොට සිත් පේළි යන ගාන අඩුයි සතා ලොකුවෙන කොට සතාගේ ජීවිතය තොර කිරීමේ ක්‍රියා වලියට සිත් පේළි වැඩ කරනවා වැඩියි. හේතුව පූර්ව චේතනාව ඊට පස්සේ වධක චේතනාව අවස්ථාව ඊට පස්සේ අපර චේතනා අවස්ථාව - ඉතිං ගොඩක් වැඩ කරනවා වැඩියි.

දැන් මරන්න කියල එළුවෙක් අල්ල ගත්තොත් ඒ එළුවා අල්ල ගැනීමේ ක්‍රියා වලිය බැඳී තිබෙන්නෙත් මරණයටමයි - එළුවා ඇදගෙන එනවා ඒ ඇදගෙන එන ක්‍රියාවලිය බැඳී තිබෙන්නේත් මරණයටමයි - එතකොට යම්කිසි තැනක ගැට හගනවා - ඒ ගැටගැහීමේ ක්‍රියාවත් මරණයටමයි බැඳී තිබෙන්නේ. ආයුධයක් ගන්නවා වටපිට බලනවා එහෙනම් වටපිට බැලීම ඇතුළු ඒ ඔක්කොම ටික මරණයට නැකම් කියන්නාවූ හිතවත් කම් කියන්නාවූ සහ සම්බන්ධ වී පවතින්නාවූ චිත්ත වීථි තමයි පහළ වෙන්නේ. එතකොට ඒ සතා මරන්න යම්කිසි අවස්ථාවක හිතුවාද ඒ හිතපු වෙලාවේ ඉඳල එයාගේ ජීවිතේ තොර කරනතාක්ම ඊට පස්සේ උනත් එයාට තියෙන්නේ - ඒ කරන ලොකු පොඩි - අපි හිතමු දුර ඉඳල එළුවෙක් අරගෙන එනවා කියල - එතකොට කර්ම වැඩි වෙනවා - යන පියවරක් පියවරක් පාසා - මේ සතා ඇදගෙන ඇදගෙන ඇදගෙන යන්නේ මරන්නනේ. එතකොට කර්ම වැඩි වෙනවා. එතකොට චිත්ත වීථි ගාන බහුල වෙනවා. ඒ චිත්ත වීථි ගාන බහුල වෙන්න බහුල වෙන්න කර්මය උඩු දුවනවා වැඩියි. ඉතිං ඒකෙන් කියන්නේ

‘ පෙර අහනක් එක් එළු දෙනක හිසසිඳා
සිය ලඟ වැළඳී ගිනි දැල් නිරය දුක්විඳා
ඇය ඇඟලෝම ගණනේ ඉස් කැපුම්ලදා
මෙම රඟවේය කාටත් අකුසලේලෙදා’

ඒ කියන්නේ ඒ ඝාතනය එතන තිබුනට ඒකට යොදා තිබෙන ක්‍රියා පටිපාටිය සංඛ්‍යා කරලා නෑ, එතකොට අපිට තේරුම් ගන්න පුළුවන් කොච්චර මෙයා මේ සම්න්ධයෙන් දරන්න ඇත්ද කියල. අනිත් එක තමයි චිත්ත වීථි දෙක තුනක් ගියත් ඒකෙ තියෙන බලයෙන් ගොඩක් ප්‍රවෘති විපාක හදන්න පුළුවන් ගතියක් තියෙනවා. මේකේ තියෙන්නේ ඇත්ත වශයෙන්ම බෙලි කැපෙන - ඒ ජීවිතය නැති වෙන්නාවූ කර්ම ඉදිරිපත් වුනා කියන එක. ඒකනිසා තේරෙනවා කොච්චර සිතුවිලි රාශියක් යන්න ඇත්ද කියල.

බොහොම පිං ස්වාමීන්වහන්ස එතෙන්දි බෙල්ල කපල මරනවා කියන අවස්ථාව විපාකයක් හැටියට ලැබෙනකොට ඒක කොයි විදියටද ස්වාමීන්වහන්ස මේ ප්‍රත්‍යය උප්පන්න ධර්ම වලට

අපි සම්බන්ධ කරන්නේ. අපි හිතුවොත් එහෙම කලින් කරන ලද අකුසල විපාකයක් නිසා මේ ජීවිතයේදී බෙලි කැපුම් කනවා කියල. එතකොට බෙලි කැපුම් කනවා කියන එක කොයි විදියටද අපි මේ විපාක ප්‍රත්‍යයයේ ප්‍රත්‍යය උප්පන්න ධර්මයන්ට සම්බන්ධ කරන්නේ ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඇත්ත වශයෙන් එතැනදී සිද්ධ වෙන්නේ චුතියනේ සිද්ධ වෙන්නේ. චුති සිත ප්‍රතිසන්ධි සිතට සමානයි. පීඩාවක් එනකොට ඒ පීඩාවල් - ඒවාගේම ඇනුම් බැණුම් එන ඒවා - ඊට පස්සේ බය ඇතිවෙන ඒවා ඔක්කොම ටික එනවා. අනිත් එක තමයි ජීවිතියේ බෙලි කැපුම් ආදී දේ ඇතිවෙන කොට බය ඇතිවෙනවා. ඊළඟට ඒවත් එක්කාසු වෙනවා - අනිත් ඒක තමයි චුතිය කියල කියන්නේ - මරණය කියල කියන්නේ මහත්තය - ප්‍රතිසන්ධියට සමානයි භවාංගය - භවාංගයට සමානයි චුතිය. ඒක එයාට - අපි හිතමු එයාට අවුරුදු 50 ඉන්න පුළුවන් එක්කෙනාට - අවුරුදු 80 ඉන්න පුළුවන් එක්කෙනාට එච්චරකල් ඉන්න දුන්නේ නෑ. ඉතින් ඒ ජීවිතයේ එයාට බලාපොරොත්තු තිබුන - නමුත් ඒක ඉස්සරහට ගෙනියන්න දුන්නේ නෑ එතැනින් චුත කරලා දානවා - කඩල දානවා - උපඝාතනය කරලා දානවා - ඒ වෙලාවට ඇති වෙන්නාවූ හිත - හිතේ තිබෙන්නාවූ චෛතසික ධර්ම ටික තමයි විපාක ප්‍රත්‍යය හැටියට ඔවුනොවුන්ට ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ.

එහෙමයි සවාමීන්වහන්ස ඒ වගේම දැන් පංචවෝකාර භවයක චුතිය සිද්ධ වෙනවනම් කර්මජ රූප හට ගන්න එක නැවතීම චුතියටත් කලින් සිද්ධ වෙනවා ඒකත් ඒ කර්ම විපාකයකින් වගේද?

<u>ස්වාමීන්වහන්සේ</u> - නෑ ඒක ඉතින් සාමාන්‍යයෙන් ධර්මතාවයක්නේ

හොඳමයි ස්වාමීන්වහන්ස ඒක තේරුණා.

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස අර කම්ම නියාම - චිත්ත නියාම - ධම්ම නියාම - ඍතු නියාම - බීජ නියාම යන නියාම ධර්ම වලට අනුව සමහර වෙලාවට ඒ උපදින කර්ම තිබුනත් තමන්ට ඒව විපාක නොදී ඉන්න පුළුවන් අවස්ථා එනවනේද ස්වාමීන්වහන්ස? කර්මඵල නොදෙන විදියේ වාතාවරණයක් හැදෙන්න පුළුවන් නේද සමහර අවස්ථාවල?

<u>පිළිතුර</u> - ඒක පුළුවන්. ඒක අපි ඉස්සෙල්ලත් මතක් කළා - අපි හිතමු යම් කිසි කර්ම කොටසක් තියෙනවා විපාක දෙන්න බෑ. එයා කුසල කර්ම කරනවා වැඩියි. ඉතින් එහෙම ඉන්න කොට එයාට විපාක දෙන්නේ නෑ. ඒක රැඳිලා block වෙලා තියෙනවා. දිව්‍යලෝකේට ගියාවූ කෙනාට දිව්‍යලෝකේ ඉන්නතාක් කල් අකුසල කර්ම තිබුනට ඒවා විපාක දෙන්නේ නෑ. එයාට දිව්‍යලෝකයට ඒ ගිය ගමන හැම වෙලේම අපි හිතමු - තුන්කෝටි හැටලක්ෂයක් කාලයක් ශක්‍රදේවේන්ද්‍ර ...... ඉන්න තාක් කල්ම ඔහොම විඳ විඳ ඉන්ට අරිනවා. විපාක දීල දීල දීල සම්පූර්ණ account එක හිස් වෙනකොට මෙහෙන් අනිත් ඒවා බලාගෙන ඉන්නවා විපාක දෙන්න. ඒකනේ ඔය කියන්නේ දිව්‍යලෝකයේ ගියත් දෙවියෙක් හැටියට හිටියත් ඒ කර්මය විපාක දීල ඉවර උනාට පස්සේ අපායේ යනවා කියල අකුසල කර්ම නිසා. ඕක චිත්ත

නියාය. ඒ කියන්නේ ධර්ම වැඩ කරන හැටි - ප්‍රත්‍යය වෙන හැටි ඔය කියන්නේ. නාම ධර්ම ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙන්නේ - රූපයන්ට ප්‍රත්‍යය වෙන්නේ - මේකේ ගැට ගැහිලා ඉන්න හින්දනේ. ඉතින් ඒක හින්ද කරන්න තියෙන්නේ මට නාමත් එපා - රූපත් එපා - කර්ම හැදෙන එකත් එපා - මෝටරෙත් එපා - machine එකත් එපා - ඒවාගේම නිෂ්පාදනත් එපා - මොකක්වත් එපා කියල ඔක්කොම ටික කඩා දාල යන එකයි. එතකොට ඒ තාක්ම බේරෙන්ට කරනවානම් කුසල කර්ම වැඩි වැඩියෙන් - වැඩි වැඩියෙන් කරනකොට ත්‍රිවිධ රත්නය මුල්කරගෙන - තුනුරුවන් මුල් කරගෙන කරන  කර්ම වැඩි කරන්ට වැඩි කරන්ට අර අකුසල කර්මයන් විපාක දෙන්ට තියෙන දේවල් හප්පන්ට බෑ. අපි හිතමු බුද්ධ සාසනයක් නැති කාලයකදී කරපු යම් යම් අකුසල කර්ම තිබුන නම් ඒවා දැන් බලාගෙන ඉන්නව එහෙන් මෙහෙන් වෙට්ටු දාන්න. එතකොට අපි බුද්ධ සාසනයක් තියෙන කාලයකදී කරන්නාවූ කුසල  කර්ම ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික ප්‍රභාෂ්වර ආලෝකමත් වූ හයිය ශක්තිය තිබෙන්නා වූ කුසල කර්ම වැඩි කරන්න වැඩි කරන්න අර නිකං අබුද්ධෝප්ප කාල වල කරපු අරව මේවා ඇවිල්ල හප්පන්න බෑ. ඒ තරම් බලවත් මේ බුද්ධසාසනයේ කරන පිං කම්. එහෙම කරන කොට අරව යටපත්වෙලා යනවා. කුසල කර්මයෙන් වහල දානවා. හැබයි වහල දාල බුද්ධ සාසනයකින් ගත යුතු වැඩේ තමයි මේ සම්පූර්ණ කුසල කර්ම - අකුසල කර්ම විපාක දෙන්ට එන එකත් වහනවා - කුසල කර්ම හැදෙන එකත් වලක්වනවා - සම්පූර්ණ operating system එකම විනාස කරලා දැමීම. එතකල් අරක කරන්න පුළුවන්.

හොඳයි එහෙම නම් ස්වාමීන්වහන්ස අදත් පැය දෙකකට  ආසන්න කාලයක් පුරා ඔබ වහන්සේ අපිට මේ බුදුරජාණන්වහන්සේගේ ඉතාම සූක්ෂම වූ ධම්ම කණ්ඩයක් වන පට්ඨාන දේශනාවෙන් විපාක ප්‍රත්‍යය ගැන අපිට කරුණු පැහැදිලි කරලා දුන්න ස්වාමීන්වහන්ස ඉතිං අප්‍රමාණ පිං. මේවාගේ දේශනා අහන්න ලැබෙන්නේ හරිම කලාතුරකින්. ඉතින් ඒ අනුග්‍රහ දක්වනවාට ඔබ වහන්සේගේ පාද නමස්කාර කොට පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස. ඔබ වහන්සේ බලපොරොත්තු වෙන ආකාරයෙන්ම සියලුම ප්‍රර්ථනා ඉෂ්ට වේවා කියල සවනට සිසිලස වෙනුවෙනුත් ඒවාගේම මෙතන සිටින කල්‍යාණමිත්‍රයින් වෙනුවෙනුත් ඒවාගේම මේ ධර්ම දේශනා පසුව අසන ඒ ශ්‍රාවකයන් වෙනුවෙනුත් ස්වාමීන්වහන්ස එහෙමනම් අද දවසේත් ඔබ වහසේට යොමු වෙන්නම් අද මේ සාකච්ඡාව නිමා කිරීම සඳහා ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි පින්වත්නි සැම දෙනාටම තෙරුවන් සරණයි! යහපතක් වේවා! ඉතින් අද අපේ නියමිත දවසක් නෙමෙයි. නමුත් අපි මේ ධර්ම කාණ්ඩයක් ධර්මකොටසක් කියල දෙන්න මේ අවස්ථාව පාවිච්චි කරා ඊයේ කරදරකාරී ස්වභාවයක් මතු වෙච්ච නිසා. ඉතින් අද මේ පින්වතුන් ඇවිල්ල විපාක ප්‍රත්‍යය පිළිබඳව එක්තරා ප්‍රමාණයකට  දැනගන්න අවස්ථාව යොදා ගත්ත. ඉතින් මේවා සිතීමෙන් මේවා ඇසීමෙන් උපදවාගන්නා වූ පිරිසිඳු ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික මහා කුසල ධර්මයන්ගේ චේතනාවන්ගේ අනුභාව බලයෙන් සැමදෙනාටම ධර්ම අවබෝධය සුවසේ සිද්ධ වේවා! තව තව සීල සමාධි ප්‍රඥා ගුණ ධර්මයන් දියුණු කරගන්න ලැබේවා! ඉතින් මේවා මෙහෙය වන්නාවූ පිනවත් දළුවත්ත මහත්මයාටත්

නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ඒවාගේම පවුලේ සැම දෙනාටමත් මේ ප්‍රශ්න ඉදිරිපත් කරමින් මෙහෙය වන්නාවූ පින්වත් ජයන්ත මහත්මයාටද ප්‍රශ්න ඇසූ ඒ පින්වත් මහත්ම මහත්මීන් සැම දෙනාටමත් සැනසිල්ලක් වේවා! ඉතින් යහපත්ව ඉවසීමෙන් සුවසේ ගුණ පුරාගෙන ඒවාගේම සැමදෙනාටම පාරමී පුරාගෙන ධර්ම මාර්ගයේ ගමන්කොට කෙලවර අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා! ඒ සඳහා මේ දහමත් මතු උපනිශ්‍රය ප්‍රත්‍යයක් වේවා කියල මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.